# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report

# 2022



**ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව**

இறக்குமதி மற்றும் ஏற்றுமதி கட்டுப்பாடுத் திணைக்களம்

**Department of Imports & Exports Control**

# කාර්යසාධන වාර්තාව - 2022

වැය ශීර්ෂය - 296

## මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

### ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

## පාලක ජනරාල්ගේ පණිවුඩය



1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ ඉතිහාසයේ, කවරදාටත් වඩා සුවිශේෂී වූ කාර්යභාරයක් ඉටුකර ලබමින් සිටින අවධියක එකී පනතින් ස්ථාපිත ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස වර්තමාන පාලක ජනරාල්වරයා වශයෙන් එම දෙපාර්තමේන්තුවේ පසුගිය වර්ෂයේ කාර්ය සාධන වාර්තාව වෙත පණිවිඩයක් නිකුත් කරන්නේ රාජ්‍ය සේවකයෙකු වශයෙන් මහත් අභිමානයකිනි.

ආනයන හා අපනයන පාලන පනතින් පැවරි ඇති බලතල ප්‍රකාරව, භාණ්ඩ ආනයනයේ දී ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමේ සාමාන්‍ය ක්‍රියාවලියෙන් ඔබ්බට ගොස් ගෙවුණු වසර තුළ මෙම දෙපාර්තමේන්තුව රටේ ආර්ථිකය හා බැඳුණු ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් සෘජුවම දායකත්වය ලබා දෙමින් කටයුතු කිරීම සුවිශේෂී වේ.

ඒ අනුව, ආනයනය හැකිතාක් අත්‍යවශ්‍ය භාණ්ඩවලට පමණක් සීමා කරමින් විදේශ විනිමය අනුපාතිකය සහ බාහිර සංචිත මත වැඩිවන පීඩනය අඩු කිරීමේ අදහසින් 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත මඟින් විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නිකුත් කරන ලද රෙගුලාසිවලට අනුගත වෙමින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකු හා ශ්‍රී ලංකා රේගුව වෙත එකී රෙගුලාසි පැනවීමෙන් අපේක්ෂිත ඉලක්ක නිසි පරිදි සාක්ෂාත් කර ගැනීම උදෙසා මෙහෙයුම් උපදෙස් නිකුත් කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය සුබදායි මාවතක් කරා රැගෙන යාමේ අරමුණ පෙරදැරිව පසුගිය කාල වකවානුව තුළ මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී දායකත්වයක් දැක් වූ බව මෙහිලා සටහන් කරන්නේ ඉමහත් සතුටිනි.

රටේ ආර්ථික අවශ්‍යතාවය මත වරින්වර නිකුත් කරනු ලබන රෙගුලාසි හේතුවෙන් අපහසුතාවයට පත්වන, මෙම දෙපාර්තමේන්තුවේ බහුතර සේවාලාභී ප්‍රජාව වන මෙරටෙහි නිෂ්පාදන හා බැඳුණු පුද්ගලික සමාගම් ව්‍යවසායකයින් ආයෝජකයින්,දේශීය කර්මාන්තකරුවන්ගේ සැබෑ අවශ්‍යතාවයන් හඳුනාගනිමින් පවතින නෛතික රාමුව තුළ එම ගැටලු, දුක්ගැනවිලි ආමන්ත්‍රණය කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළ සකස් කරමින් දෙපාර්තමේන්තුව භෞතික වශයෙන් මෙන්ම, ආකල්පමය වශයෙන් ද නව්‍යකරණයට ලක් කිරීමට අවශ්‍ය තීන්දු, තීරණ ගැනීම ද මෙම කාලවකවානුව තුළ සිදු වූ අතර, ඒ සඳහා දෙපාර්තමේන්තුවේ සෙසු මාණ්ඩලික නිලධාරීන් හා අනෙකුත් සේවක පිරිස දැක්වූ සහයෝගය කෘතවේදීව මෙහිලා සටහන් කරමි.

තව ද, මෙම අභියෝගාත්මක කාල පරිච්ඡේදය තුළ මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් ලද මාර්ගෝපදේශකත්වය ද සැළකිය යුතු වේ. එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුවේ කාර්යය හා සෘජුවම බැඳුණු ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු පද්ධතියන්, අනෙකුත් නිර්දේශ සපයනු ලබන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහය ස්තුතිපූර්වකව මෙහි සටහන් කරමි.

ඉදිරියේදී මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය තවදුරටත් කාර්යක්ෂම කිරීම පිණිස දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය හා එක්ව නව බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියක් හඳුන්වා දීම, දෙපාර්තමේන්තුවේ භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම, සේවාලාභී ප්‍රජාව ආනයන අපනයන නීති රීති හා දෙපාර්තමේන්තුවේ ක්‍රමවේදයන් සම්බන්ධයෙන් දැනුවත් කිරීම, දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වැඩි දියුණු කිරීම, දෙපාර්තමේන්තු ක්‍රියාවලිය අධ්‍යයනය කොට වැඩිදියුණුකිරීම ආදී වැඩ පියවර රැසක් සැලසුම්කර ඇති අතර, ඒ සඳහා කාල රාමු සකස් කොට තිබේ.

ඒ අනුව 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනත මඟින් ආවරණය වන නෛතික රාමුව තුළ රජයේ ආර්ථික ප්‍රතිපත්ති හා අනුගත වෙමින් පෞද්ගලික අංශය බහුතරයක් වන සේවාලාභීන්ගේ අපේක්ෂාවන් ඉටුවන පරිදි ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මෙහෙයවමින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීමට ඇප කැප වන්නට දෙපාර්තමේන්තුවේ අපි සියල්ල එක්ව අදිටන් කර ගනිමු.

**ටී.ටී. උපුල්මලී ප්‍රේමතිලක**
ආනයන හා අපනයන පාලක ජනරාල්

# පටුන


| | |
|---|---|
| **1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය** | **01** |
| 1.1 හැඳින්වීම | 01 |
| 1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු | 02 |
| 1.3 දෙපාර්තමේන්තුවේ වගකීම් හා කාර්යභාරය | 03 |
| 1.4 සංවිධාන ව්‍යුහය හා සටහන | 04 |
| **2 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | **07** |
| 2.1 2022 වර්ෂය තුළ ප්‍රකාශයට පත්කරන ලද නව විධිවිධාන | 07 |
| 2.2 ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන නියාමන ප්‍රතිපත්තිය දියුණු කිරීම. | 19 |
| 2.3 ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම | 22 |
| 2.4 පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය | 33 |
| 2.5 ආනයන හා අපනයන ගෙවීම් ක්‍රම සහ නියෝග | 35 |
| 2.6 විමර්ශන කවුළුව | 37 |
| **3 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය** | **38** |
| 3.1 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 38 |
| 3.2 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 39 |
| 3.3 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 40 |
| 3.4 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය | 41 |
| 3.5 2022 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය | 42 |
| 3.6 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 42 |
| 3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය | 42 |
| 3.8 විගණකාධිපතිගේ වාර්තාව | 43 |
| **4 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය** | **55** |
| 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | 55 |
| **5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සාක්ෂාත් කරගැනීමේ කාර්යසාධනය** | **55** |
| 5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු | 56 |
| 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග | 59 |
| **6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ** | **59** |
| 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය | 59 |
| 6.2 දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම | 60 |
| 6.3 මානව සම්පත් සංවර්ධනය | 60 |
| **7 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව** | **62** |
| **සමාප්ති සටහන** | **69** |

# 1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත මඟින් පිහිටුවන ලද ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව අඩ සියවසකටත් වැඩි කාලයක් තුළ ශ්‍රී ලාංකේය අනන්‍යතාව සුරක්ෂිත කරනු වස් විශාල කාර්යයභාරයක් ඉටු කරනු ලබන රාජ්‍ය ආයතනයකි. ආනයන හා අපනයන බලපත්‍ර නියාමන අධිකාරියක් වශයෙන් ක්‍රියාත්මක වීම මූලික අරමුණ වූව ද මෙරට ආර්ථිකය තුළ පහසුකම් සපයන්නෙකු වශයෙන් ද විශාල කාර්යයභාරයක් මෙම දෙපාර්තමේන්තුවෙන් සැලසෙයි.

2022 වසර විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය හේතු කොට ගෙන ශ්‍රී ලංකා ආර්ථිකයට දැඩි අභියෝගාත්මක වසරක් විය. ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවර කර ගැනීමේ රජයේ ඒකායන අරමුණට සහයෝගය දක්වමින් ආනයන හා අපනයන කටයුතු, සේවාලාභීන් කේන්ද්‍ර කර ගත් සුහුරු අතුරු මුහුණත් පහසුකම් සලසමින් ද ආනයන හා අපනයන කටයුතු ප්‍රවර්ධනය හා කාර්යක්ෂම පරිදි පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පාලන විධිවිධාන නිකුත් කර සිය සමාජ වගකීම් ඉටු කරමින් ද සිය මෙහෙවර පුළුල් කර ඇත. එසේ ම, දේශීය කර්මාන්ත හා මහජන සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් ප්‍රතිපත්තිමය වශයෙන් ආනයන හා අපනයන අයිතම ප්‍රමිතිගත බවට වග වෙමින් විනිමය පාලන දෙපාර්තමේන්තුවත් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවත් පහසුකම් සපයන මූල්‍ය ආයතන ද සම්බන්ධ කර ගනිමින් සිය කාර්යයභාරය වඩා පුළුල් ක්ෂේත්‍රයක් වෙනුවෙන් පහසුකම් සලසා ඇත.

ලෝක රේගු සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන සංයෝජිත වර්ගීකරණ සංකේතාංකයන්ට අනුව මුදල් අමාත්‍යාංශයේ උපදෙස් හා සහාය ඇති ව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් දේශීය ආර්ථික ප්‍රතිපත්තිවලට අනුගතව ආනයන හා අපනයන පාලනය මඟින් පාලිත අයිතම පිළිබඳ ලැයිස්තු මහජනතාව වෙත ප්‍රකාශයට පත් කිරීමත් මෙහිලා ප්‍රමුඛ කාර්යයක් වන්නේ ය.

තවදුරටත් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මඟින් ජනතා කේන්ද්‍රීය වූ ඩිජිටල් පහසුකම් සහිත මෘදුකාංග පද්ධතියක් සංවර්ධනය උදෙසා පූර්ණ ස්වයංක්‍රීය ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීම මඟින් සේවාලාභීන් සඳහා වඩාත් කාර්යක්ෂම සේවයක් සැලසීම වෙනුවෙන් වැඩපිළිවෙළක් සකසමින් සිටින අතර, ආනයන හා අපනයන පාලක ජනරාල් ඇතුළු කාර්යය මණ්ඩලය සෑම විට ම රටේ ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍ය, පරිසර සංරක්ෂණය ද සැලකිල්ලට ගනිමින් තෘප්තිමත් සේවාලාභී කාර්යයසාධනයක් වෙනුවෙන් නිතිපතා කැපවීමෙන් කටයුතු කරනු ලැබේ.

## 1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

### 1.2.1 ආයතනික දැක්ම

තිරසර සංවර්ධිත රටක් උදෙසා
ආනයනය හා අපනයනය නියාමනය

### 1.2.2 ආයතනික මෙහෙවර

රටේ ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍යය, පරිසර සංරක්ෂණය ආදිය සැලකිල්ලට ගෙන, භාණ්ඩ ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත අනුව ක්‍රියාත්මක කිරීම.

### 1.2.3 අරමුණු

රටේ ආරක්ෂාව තහවුරු කිරීම, ආර්ථිකය නංවාලීම සහ මහජන සෞඛ්‍යය හා පරිසරය ආරක්ෂා කිරීම සඳහා රජය විසින් කලින් කලට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට අනුකූලව ආනයන හා අපනයන නියාමනය කිරීම.

### 1.3 දෙපාර්තමේන්තුවේ වගකීම් හා කාර්යභාරය

i. ආනයන හා අපනයන පාලනයට අදාළ රෙගුලාසි ඇතුළත් ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කිරීම.
ii. ආනයන හා අපනයන පාලන රෙගුලාසිවලට යටත්ව මෙරට ආර්ථිකයේ යහපත උදෙසා බලපත්‍ර නිකුත් කිරීම.
iii. උපායමාර්ගික වෙළඳ කළමනාකරණ ක්‍රමයක් සහ ගෝලීය බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමයක් ඇති කිරීම සම්බන්ධයෙන් අදාළ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.
iv. ශ්‍රී ලංකාවේ දේශීය සහ විදේශීය වෙළෙඳාම දියුණු කිරීම සඳහා වන ලෝක වෙළඳ සංගමයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම.
v. මොන්ට්‍රියල් සම්මුතියට අනුව ඕසෝන් වියනට හානි කරන වායූන් ආනයනය පාලනය කිරීම.
vi. ආනයන හා අපනයන පාලනයට අදාළව මෙහෙයුම් මාර්ගෝපදේශ වාණිජ බැංකුවලට නිකුත් කිරීම.
vii. ජාත්‍යන්තර වාණිජමය ගනුදෙනුවලට අදාළ වන ගෙවීම් ක්‍රම ප්‍රකාශයට පත් කිරීම හා නියාමනය කිරීම.
viii. ආනයන හා අපනයන පාලන ප්‍රතිපත්තීන්ට අනුව, විදේශ විනිමය වැය නොවන පදනම මත කරනු ලබන ආනයන සඳහා අනුමැතීන් ලබාදීම.
ix. ආනයන හා අපනයන පාලන රෙගුලාසි සම්බන්ධයෙන් පැන නගින ගැටලු සහගත අවස්ථාවලදී රේගු අධ්‍යක්ෂ ජනරාල්ට සහ විනිමය පාලකට අවශ්‍ය සහාය ලබාදීම.
x. අදාළ රජයේ ගාස්තු එක්රැස් කර, ඒකාබද්ධ අරමුදලට බැර කිරීම.

## 1.4 සංවිධාන ව්‍යුහය හා සටහන

මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ආනයන හා අපනයන පාලක ජනරාල්වරයා ආයතන ප්‍රධානියා වශයෙන් කටයුතු කරනු ලබයි.

1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත ප්‍රකාරව ක්‍රියාත්මක කරන නීති රීති, රෙගුලාසි පැනවීම් හා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම් ඇතුළු සමස්ථ ආනයන හා අපනයන පාලන ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය කර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව පහත සඳහන් අංශ හා ඒකක වලින් සමන්විතව ක්‍රියාත්මක කරනු ලැබේ.

I. ආයතන අංශය
II. ගිණුම් අංශය
III. පර්යේෂණ හා ප්‍රතිපත්ති අංශය
IV. අභ්‍යන්තර විගණන අංශය
V. බලපත්‍ර නිකුත් කිරීමේ අංශ
- ඒකක 1 - ඖෂධ හා ශෛල්‍ය උපකරණ
- ඒකක 2 - පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස්
- ඒකක 3 - රසායනික ද්‍රව්‍ය, පොහොර, පලිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය
- ඒකක 4 - ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ
- ඒකක 5 - වෙනත් ආනයන සහ අපනයන

VI. තොරතුරු තාක්ෂණ අංශය

මෙම කර්තව්‍ය කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ තත්‍ය කාර්යමණ්ඩලය පහත සඳහන් සංවිධාන ව්‍යුහය (Organization Chart) යටතේ සේවාලාභින් වෙත නිරතුරුව සේවය කිරීමට කැපවීමෙන් ක්‍රියාකරනු ලබයි.


2022.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 111ක් වන අතර ජොෂ්ඨ මට්ටමේ සිට ප්‍රාථමික මට්ටම දක්වා පුරප්පාඩු 19ක් පැවතියද පවතින කාර්ය මණ්ඩලය තුළ මහජනතාව වෙත ප්‍රශස්ත සේවයක් ලබාදීමට 2022 වර්ෂයේදී කටයුතු කර ඇත.

කාර්යමණ්ඩල තොරතුරු ලේඛනය පහතින් දැක්වේ.

## 2022.12.31 දිනට කාර්යමණ්ඩල තොරතුරු

| තනතුර | | | | | අනුමත කාර්ය මණ්ඩලය | අතිරේක කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|
| ආනයන හා අපනයන පාලක ජනරාල් | ශ්‍රී.ලං.ප.සේ | විශේෂ | SL 3 | විධායක | 1 | | 1 | 0 |
| ආනයන හා අපනයන පාලක | ශ්‍රී.ලං.ප.සේ | I | SL 1 | විධායක | 2 | | 2 | 0 |
| නියෝජ්‍ය/සහකාර පාලක | ශ්‍රී.ලං.ප.සේ | II/III | SL 1 | විධායක | 6 | | 5 | 1 |
| ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග.සේ | I | SL 1 | විධායක | 1 | | 1 | 0 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ | I | SL 1 | විධායක | 1 | | 1 | 0 |
| නීති නිලධාරි | | II/III | SL 1 | විධායක | 1 | | 0 | 1 |
| සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා තාක්ෂණ) | ශ්‍රීලං.තො.තා.සේ | III | SL 1 | විධායක | 1 | | 0 | 1 |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | | **13** | | **10** | **3** |
| පරිපාලන නිලධාරි | ක.සේ.නි.සේ. | අධි | MN 7 | තෘතියික | 1 | | 0 | 1 |
| භාෂා පරිවර්තක | භා.ප.සේ. | I/II | MN 6 | තෘතියික | 2 | | 1 | 1 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | ශ්‍රීලං.තො.තා.සේ | II | MN 6 | තෘතියික | 1 | | 1 | 0 |
| **තෘතියික මට්ටම** | | | | | **4** | | **2** | **2** |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | | III | MT 1 | | 2 | | 1 | 1 |
| දත්ත කළමනාකරණ සහකාර | දෙපාර්මේන්තුගත | | MN 4 | ද්විතියික | 1 | | 1 | 0 |
| විමර්ෂණ සහකාර | දෙපාර්මේන්තුගත | | MN 4 | ද්විතියික | 1 | | 1 | 0 |
| සංවර්ධන නිලධාරි | සං.නි.සේ | I/II/III | MN 4 | ද්විතියික | 13 | 11 | 13 | 0 |
| කළමනාකරණ සේවා නිලධාරි | ක.සේ.නි.සේ. | I/II/III | MN 2 | ද්විතියික | 57 | | 46 | 11 |
| **ද්විතියික මට්ටම** | | | | | **74** | | **62** | **12** |
| රියදුරු | රියදුරු සේ. | I/II/III | PL 3 | ප්‍රාථමික | 5 | | 4 | 1 |
| කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ. | I/II/III | PL 1 | ප්‍රාථමික | 15 | | 14 | 1 |
| **ප්‍රාථමික මට්ටම** | | | | | **20** | | **18** | **2** |
| **එකතුව** | | | | | **111** | **11** | **92** | **19** |

## සංවිධාන සටහන (Organization Chart)



# 2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 2022 වර්ෂය තුළ ප්‍රකාශයට පත්කරන ලද නව විධිවිධාන

කොවිඩ් - 19 වසංගතයත් සමඟම 2021 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ආර්ථිකමය වශයෙන් යම් පසුබෑමකට පත් වූ අතර, එය 2022 වන විට ක්‍රමයෙන් තවදුරටත් සෘණාත්මක බලපෑමක් ඇති කර වීය.ශ්‍රී ලංකා රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව දිගින් දිගට ම අවප්‍රමාණය වීම හේතු කොට ගෙන නැවතත් වෙළෙඳ ශේෂය හා ගෙවුම් ශේෂය මත වන පීඩනය ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වන්නට විය.

2021 වර්ෂයේ පැවති කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය යටතේ පැවති ජාතික ආර්ථිකය 2022 වර්ෂයට ද ඒ ආකාරයටම බලපාන ලදී.2022 වර්ෂයේ මුල් භාගයේදී ඇතිවූ ඛනිජ තෙල් ඌනතාවය, ප්‍රමාණවත් ඖෂධ හා අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීමේ දුෂ්කරතාවය මෙන්ම 2021 වර්ෂයේ පැවති රසායනික පොහොරවල හිඟතාවය හේතුවෙන් 2022 වර්ෂයේදී මෙරට කෘෂිකර්මාන්තයේදී ප්‍රධාන වශයෙන් වී වගාවට මෙන්ම අනෙකුත් වගාවන්ට යල - මහ කන්න වලදී ඇතිවූ ඛේදනීය බලපෑම නිසාද සමස්තයක් වශයෙන් මෙරට ජාතික ආර්ථිකයට වූ බලපෑම් ඒ ඒ ක්ෂේත්‍ර ගණනාවන්ට අඩු වැඩි වශයෙන් සෘජු හා වක්‍ර ආකාරවලින් බලපෑම් එල්ල විය.

එමෙන් ම, 2020, 2021 යන වර්ෂවල ආනයන හා අපනයන පාලන යටතේ වරින්වර නිකුත් කරන ලද ආනයන සීමා කිරීමේ ප්‍රතිපත්තිය යටතේ ඇතැම් කර්මාන්තශාලා සඳහා ආනයන කරනු ලබන අමුද්‍රව්‍ය සීමාව හේතුකොට ගෙන දේශීය කර්මාන්තශාලා සඳහා මෙන්ම විදේශීය වෙළඳපළ සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍යවල හිඟතාවයක් ඇති වීම හේතුකොට ගෙන විශේෂයෙන්ම අපනයන කර්මාන්තයට බොහෝ බලපෑම් එල්ලවිය.

එසේම, විදේශ ශ්‍රමිකයන්ගේ මුදල් ගලා ඒම මෙන්ම, සෘජු ආනයන සහ ප්‍රතිඅපනයනයන් අඩුවීමත් මෙරට ආර්ථිකය තුළ මූල්‍ය සංසරණ පද්ධතිය හෙවත් ජනතාවගේ ක්‍රය ශක්තිය මෙන්ම, ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීම මත ගෙවුම් ශේෂය මත වන පීඩනය සහ වෙළඳ ශේෂය මත වන පීඩනය අඛණ්ඩව සෘණාත්මක බලපෑමක් පෙන්නුම් කරන ලදී.

එවැනි දුර්භාග්‍ය සම්පන්න ආර්ථික රාමුවක් මත සිට ගෙන මෙරට ආර්ථික රාමුව පුනර්ජීවනය කර ගැනීම සඳහා 2022 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව මෙන්ම රාජ්‍ය සහ වාණිජ බැංකු ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන ලදී. විශේෂයෙන් අනියම් ආකාරයෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරට මුදල් ගලා යාම(උණ්ඩියල් සහ හවාලා ක්‍රම) හරහා ශ්‍රී ලංකාවේ මුදල් විතැන් වීම අවම කිරීම සඳහා 2022 මැයි මස 06 වන දින විවෘත ගිණුම් සහ භාණ්ඩ විකිණීමේ පදනම මත ගෙවීම් ක්‍රම අත්හිටුවන ලද අතර, සෘජු හා වක්‍ර අපනයනකරුවන් සඳහා පමණක් අවස්ථාව ලබා දීම මඟින් අපනයන ආදායම අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කරන ලද අතර, ඉහත සඳහන් අනියම් මුදල් ගලා යෑම් පාලනය කර ගත හැකි විය. එබැවින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය සංචිතය පාලනය කර ගැනීමට සහ විදේශ විනිමය අනුපාතයන් ස්ථාවර කර ගැනීමට යම්තාක් දුරට හැකි විය.

එමෙන්ම, ඉහත කරුණු හේතුකොටගෙන දේශීය වෙළෙඳපළ තුළ උද්ගත වුණු භාණ්ඩ හිඟතාවය මඟ හැරීම වස්, 2022.06.24 දිනැති අංක 2285/19 දරන නව අතිවිශේෂ ගැසට්පත්‍රයක් මඟින් ඉහත අපනයනකරුවන්ට අමතරව දේශීය ව්‍යවසායකයන් හා කර්මාන්තකරුවන් තවදුරටත් ආරක්ෂා කර ගැනීම සඳහා යම් යම් නිශ්චිත කොන්දේසිවලට යටත්ව දේශිය කර්මාන්ත තුළ නිමිද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමට අවස්ථාව ලබා දීම මඟින් පාරිභෝගිකයාහට සාධාරණව භාණ්ඩ හා සේවා පරිභෝජනය කිරීමට අවස්ථාව ලබා දීම නිරාවරණය විය.

එමෙන්ම,විවෘත ගිණුම් ක්‍රමය (OA) හරහා පාරිභෝගිකයාට අත්‍යවශ්‍ය වන සහ මනා ආහාර සුරක්ෂිතතාවයක් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන කිරිපිටි, රතු පරිප්පු, බඩ ඉරිඟු, හාල්මැස්සන්, වියළි මිරිස් සහ පාන් පිටි ඇතුළු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 12ක් පමණ වෙළෙඳ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය ලේකම්වරයාගේ නිර්දේශ යටතේ ආනයනය කිරීමට අවස්ථාවක් ලබා දෙන ලදී.

මෙමඟින් දේශීය වෙළඳපොළ තුළ එකී භාණ්ඩ හිඟතාවයකින් තොරව සාධාරණ පිරිවැයක් දරා ප්‍රමාණාත්මකව මිලදී ගැනීමේ හැකියාව ලැබිණි.

එමෙන්ම විදේශ විනිමය සංචිතයෙන් රුපියලේ අගය අවප්‍රමාණය වීම වළක්වාලීම සඳහා ආනයන පාලන පනත යටතේ 2022 අගෝස්තු මස 23 වන දින ප්‍රකාශිත අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන තාවකාලිකව අත්හිටුවීමට ක්‍රියාකරන ලදී.එමඟින් අත්‍යවශ්‍ය නොවන අයිතම 1464 ක් මෙරටට ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවීම මඟින් අත්‍යවශ්‍ය ආනයනයන් සඳහා විදේශ සංචිත මහභාණ්ඩාගාරයේ පවත්වා ගෙන යාමත් දේශීය වෙළඳපොළ තුළ එම ආනයනික භාණ්ඩ හිඟ වීම දේශීය ව්‍යාපාරිකයින්ගේ නිෂ්පාදන සඳහා මහත් රුකුලක් විය. එසේම දේශීයව පවත්වා ගෙන යනු ලබන ඇතැම් කර්මාන්ත සඳහා අත්හිටුවන ලද අමුද්‍රව්‍යයන් ආනයනය කිරීමට අවස්ථාව ලබා දෙන ලදී.

ඒ සඳහා විධිවිධාන සකසමින් 2022 සැප්තැම්බර් මස 9 වන දින සිට තාවකාලිකව ආනයනය අත්හිටුවන ලද භාණ්ඩ 708 ක් නැවත ආනයනය සඳහා ඉඩ ප්‍රස්තාව සලසා දෙන ලදී.

2022 දෙසැම්බර් මස වන විට ආනයන ලිහිල් කිරීමේ ප්‍රතිපත්තිය මත සිට දේශීය නිෂ්පාදන සඳහා අවශ්‍ය වන තවත් ආනයනික භාණ්ඩ 71 ක් ආනයනය කිරීමට අවසර ලබා දෙන ලදී.

ඒ අනුව, ඉහත සඳහන් විධිවිධාන මඟින් ජාතික ආර්ථිකයට මුල්තැන දෙමින් මෙම දෙපාර්තමේන්තුව මඟින් ඊට අයත් කාර්යයන් හා වගකීම ප්‍රාමාණිකව ඉතා ඉහළ ධාරිතාවයකින් සම්පූර්ණ කිරීමට හැකියාවක් ලැබී ඇතිබව සනාථ කළ හැකිය.

**2.1.1 2022 වර්ෂයේ ප්‍රකාශයට පත්කරන ලද ගැසට් නිවේදන**

| අනු අංකය | අතිවිශේෂ ගැසට් නිවේදන අංකය | දිනය | විස්තරය |
|---|---|---|---|
| 1 | 2262/16 | 2022.01.11 | LP ගෑස් සහ එහි ආනුෂංගික උපාංග ප්‍රමිති පරික්ෂා කිරීමේ ක්‍රමවේදයක් මගින් නියාමනය කිරීම සඳහා ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන රෙගුලාසි හඳුන්වා දීම සහ සීනි සඳහා සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල ජාතික උප බෙදුම් කාණ්ඩයක් නිර්මාණය කර ඒවා ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන රෙගුලාසි යටතට ගෙන ඒම. |
| 2 | 2262/17 | 2022.01.11 | සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල ජාතික උප බෙදුම් කාණ්ඩයක් නිර්මාණය කර ආනයන බලපත්‍ර ක්‍රමය යටතට තෝරාගත් සාගර ජීවී විශේෂවල කවච සහ සීනි වලට අයත් සංයෝජිත වර්ගීකරණ කේත කාණ්ඩයන් ගෙන ඒම. |
| 3 | 2262/18 | 2022.01.11 | සහල් සහ මත්ස්‍ය නිෂ්පාදන සඳහා නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල ජාතික උප බෙදුම් නිර්මාණය කර තෝරාගත් සහල් වර්ග තාවකාලිකව අත්හිටුවීමේ උපලේඛනයෙන් ඉවත් කිරීම සහ මත්ස්‍ය නිෂ්පාදන සඳහා නිර්මාණය කල නව සංකේතාංක තාවකාලිකව අත්හිටුවීමේ උපලේඛනයට ඇතුළත් කිරීම. |
| 4 | 2262/34 | 2022.01.13 | සත්ත්ව ශුක්‍ර බාධාවකින් තොරව ආනයනය කිරීමට පහසුකම් සැලසීම. |
| 5 | 2270/18 | 2022.03.09 | හඳුනාගත් අත්‍යවශ්‍ය නොවන හා හදිසි නොවන භාණ්ඩ ආනයනය අධෛර්යමත් කිරීම/ පාලනය කිරීම සඳහා එම භාණ්ඩ අතරින් තෝරාගත් භාණ්ඩ 369ක් ආනයන බලපත්‍ර ක්‍රමවේදය යටතට ගෙනඒම. |
| 6 | 2274/42 | 2022.04.09 | 2022 මාර්තු මස 09 දිනැති 2022 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මඟින්, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ 369ක් සඳහා පනවනු ලැබූ ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවය 2022 අප්‍රේල් මස 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි අඛණ්ඩව පවත්වාගෙන යාම. |
| 7 | 2278/21 | 2022.05.06 | විවෘත ගිණුම් (OA), භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම,ගෙවීම් මත ලේඛන(DP) සහ පිළිගැනීම් මත ලේඛන(DA) යන ගෙවීම් ක්‍රම වල මෙහෙයුම් (යෙදවුම්) නියාමනය කිරීම. |
| 8 | 2282/21 | 2022.05.31 | 2022 මාර්තු 09 දිනැති 2022 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සහ 2022 අප්‍රේල් 09 දිනැති 2022 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි අවලංගු කිරීම. |
| 9 | 2282/22 | 2022.05.31 | 2022 මැයි 06 දිනැති අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි බලාත්මක වන කාලය දීර්ඝ කිරීම |
| 10 | 2285/19 | 2022.06.24 | 2022 මැයි 06 දිනැති අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි ලිහිල් කිරීම. |
| 11 | 2291/44 | 2022.08.05 | ආනයන පාලන බලපත්‍රයකට යටත් ව ග්ලයිෆොසේට් ආනයනය සඳහා අවසර ලබා දීම. |

| | | | |
|---|---|---|---|
| 12 | 2294/29 | 2022.08.23 | දැනට පවතින ආනයන පාලන රෙගුලාසීන්හි විධිවිධාන කිහිපයක් ලිහිල් කිරීම සහ ආනයන පාලන බලපත්‍රයකට යටත්ව බයිසිකල් සහ විද්‍යුත් මෝටර් සයිකල් ආනයනය සඳහා අවසර ලබා දීම |
| 13 | 2294/30 | 2022.08.23 | තෝරාගත් භාණ්ඩ වර්ග 1,464ක් (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක) ආනයනය තාවකාලිව අත්හිටුවීම. |
| 14 | 2296/30 | 2022.09.09 | 2022 අගෝස්තු 23 දිනැති 2022 අංක 13 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මඟින් ආනයනය තාවකාලිකව තහනම් කළ භාණ්ඩ උපලේඛනයෙන් තෝරාගත් භාණ්ඩ 708 ක් (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක) ඉවත් කිරීම. |
| 15 | 2297/79 | 2022.09.16 | විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා අවසර ලබාදුන් කාල සීමාව දිර්ඝ කිරීම |
| 16 | 2298/55 | 2022.09.23 | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයෙන් බලපත්‍රයක් ලබා ගන්නා ලද විදේශයන් හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් හට පූර්ණ විදුලි වාහන ආනයනය කිරීමට අවසර ලබා දීම. |
| 17 | 2300/12 | 2022.10.05 | කෘෂි බීජ, කෘෂි රසායන ද්‍රව්‍ය හා රසායනික පොහොර අයිතම ආනයනය කිරීමේ දී පෙර ගෙවීම් සීමාව ඇමරිකානු ඩොලර් 50,000 සිට ඇමරිකානු ඩොලර් 250,000 දක්වා වැඩි කිරීම. |
| 18 | 2302/31 | 2022.10.21 | සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා කැඩුණු (සුනු) සහල් ආනයනය කිරීමට අවසර ලබා දීම. |
| 19 | 2304/04 | 2022.10.31 | විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ තිරිඟු පිටි ආනයනය කිරීම සඳහා අවසර ලබාදුන් කාල සීමාව දිර්ඝ කිරීම |
| 20 | 2304/05 | 2022.10.31 | අනුමත ජාත්‍යන්තර ගුවන් සේවා සපයන්නන්හට, ගුවන් යානා නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් සහ උපාංග ආනයන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ආනයනය කිරීමට ඉඩ ලබා දීම. |
| 21 | 2307/12 | 2022.11.23 | 2022 අගෝස්තු 23 දිනැති 2022 අංක 13 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මඟින් ආනයනය තාවකාලිකව තහනම් කළ භාණ්ඩ උපලේඛනයෙන් තෝරාගත් භාණ්ඩ 62 ක් (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක) ඉවත් කිරීම. |
| 22 | 2308/26 | 2022.12.01 | සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය බඩ ඉරිඟු සහ සෝයා බෝංචි ආහාර, විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනය කිරීමට අවසර ලබා දුන් කාල සීමාව දීර්ඝ කිරීම. |
| 23 | 2309/40 | 2022.12.09 | සහල් ආනයනය සඳහා ආනයන පාලන බලපත්‍ර ලබා දීම තාවකාලිකව අත්හිටුවීම . |

| | | | |
|---|---|---|---|
| 24 | 2311/08 | 2022.12.19 | 2022 අගෝස්තු 23 දිනැති 2022 අංක 13 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මඟින් ආනයනය තාවකාලිකව තහනම් කළ භාණ්ඩ උපලේඛනයෙන් තෝරාගත් භාණ්ඩ 09 ක් (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක) ඉවත් කිරීම. |
| 25 | 2311/18 | 2022.12.21 | විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ රසායනික පොහොර ආනයනය කිරීමට මාස හයක (06) කාලයක් සඳහා අවසර ලබාදීම. |

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2262/16 – 2022.01.11 - LP ගෑස් සහ අදාළ ආනුෂංගික උපාංග ප්‍රමිති පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් මගින් නියාමනය කිරීම සහ සීනි සඳහා ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන රෙගුලාසි හඳුන්වා දීම.**

ප්‍රමිතියෙන් අඩු LP ගෑස් සහ අදාළ ආනුෂංගික උපාංග ආනයනය කිරීම වළක්වාලමින් එම අයිතම එහි අනුෂංගික උපාංග ප්‍රමිති පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් මගින් නියාමනය කිරීම, ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් මත පදනම්ව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක වල ජාතික උප බෙදුම් සංශෝධනය කර පරිභෝජන අවශ්‍යතා සඳහා සීනිවල ගුණාත්මකභාවය සහතික කිරීමට ආනයන හා අපනයන ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන රෙගුලාසි යටතේ ඒවා ලැයිස්තුගත කිරීම ද සිදු කර ඇත.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2262/17 – 2022.01.11 – ආනයන පාලන බලපත්‍ර ක්‍රමවේදය යටතේ සාගර ජීවී විශේෂයක කවච සහ දුඹුරු සීනි ආනයනය නියාමනය කිරීම**

ජාත්‍යන්තර ගිවිසුම්වලට අනුකූලව ශ්‍රී ලංකාවේ සාගර සම්පත් ආරක්ෂා කිරීම උදෙසා ශ්‍රී ලංකාවට සාගර ජීවී විශේෂයක කවච ආනයනය නියාමනය සහ අධීක්ෂණය කිරීමට සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල ජාතික උප බෙදුම් කාණ්ඩයක් නිර්මාණය කර ආනයන බලපත්‍ර ක්‍රමය යටතට තෝරාගත් සාගරජීවී විශේෂවල කවච ගෙන ඒම සහ දේශීය නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා ආනයන පාලන බලපත්‍ර ක්‍රමවේදය යටතේ දුඹුරු සීනි නියාමනය කිරීමද සිදු කර ඇත.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2262/18– 2022.01.11– මත්ස්‍ය නිෂ්පාදන සඳහා නිර්මාණය කල නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල ජාතික උප බෙදුම් තාවකාලික අත්හිටුවීමේ උපලේඛනයට ඇතුළත් කිරීම.**

සහල් හිඟය සපුරාලීමට සහ පාරිභෝගිකයින්ට දැරිය හැකි ලෙස සහල්වල සිල්ලර මිල කළමනාකරණය කිරීම සඳහා තෝරාගත් සහල් වර්ග ආනයනය කිරීමට අවසර දීමට රජය ගත් තීරණයට අනුව, සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල ජාතික උප බෙදුම් නිර්මාණය කර එසේ තෝරාගත් සහල් වර්ග, තාවකාලිකව අත්හිටුවීමේ උපලේඛනයෙන් ඉවත් කිරීමත්, 2021 ජූනි 11 දිනැති අංක 18/2231 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ආනයනය තාවකාලිකව අත්හිටුවන ලද මත්ස්‍ය නිෂ්පාදන සඳහා සකස් කරන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල ජාතික උප බෙදුම් තාවකාලික ආනයනය අත්හිටුවීමේ උපලේඛනයට ඇතුළත් කිරීම සිදු කර ඇත.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2262/34 - 2022.01.13 - සත්ත්ව ශුක්‍ර බාධාවකින් තොරව ආනයනය කිරීමට පහසුකම් සැලසීම.**

කිරි හා පශු සම්පත් කර්මාන්තයේ ශීඝ්‍ර වර්ධනයට පහසුකම් සැලසීම සඳහා වැදගත් අවශ්‍යතා වලින් එකක් වන අභිජනන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සත්ත්ව ශුක්‍ර බාධාවකින් තොරව ආනයනය කිරීමට පහසුකම් සැලසීම සඳහා සංයෝජිත වර්ගීකරණ කේත 0511.10.00, 0511.99.20 සහ 0511.99.30 යටතේ වර්ගීකරණය කර ඇති සත්ත්ව ශුක්‍රාණු ආනයනය කිරීමේ දී ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාව ඉවත් කිරීම සිදු කර ඇත.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2270/18 - 2022.03.09 - හඳුනාගත් අත්‍යවශ්‍ය නොවන හා හදිසි නොවන භාණ්ඩ ආනයනය අධෛර්යමත් කිරීම/ පාලනය කිරීම සඳහා එකී භාණ්ඩ අතරින් තෝරාගත් භාණ්ඩ ආනයන බලපත්‍ර ක්‍රමවේදය යටතට ගෙනඒම.**

කර්මාන්ත හා අත්‍යවශ්‍ය සේවා සඳහා උවමනා කරන අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම සඳහා මූලිකත්වයක් ලබා දීමේ අභිප්‍රායෙන් අත්‍යවශ්‍ය නොවන හා හදිසි නොවන භාණ්ඩ ආනයන සීමා කිරීම යන මැයෙන් මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ 2022 මාර්තු මස 04 වන දිනැති අංක 22/0363/304/024 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව තෝරාගත් අත්‍යවශ්‍ය නොවන හා හදිසි නොවන භාණ්ඩ ආනයනය, ආනයන බලපත්‍ර ක්‍රමවේදය යටතට ගෙන, මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත ආනයන පාලන බලපත්‍රයක් යටතේ ආනයනය කිරීමට අවසර ලබාදීම සිදු කර ඇත.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2274/42 - 2022.04.09 - භාණ්ඩ 369 ආනයනය නියාමනය/සීමා කිරීමටත්, ඒ සඳහාවූ ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවය 2022 අප්‍රේල් මස 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි අඛණ්ඩව පවත්වාගෙන යාම.**

2022 මාර්තු මස 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්‍යවශ්‍ය නොවන හා හදිසි නොවන භාණ්ඩ 369ක් ආනයනය සඳහා ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතා පනවමින් 2022 මාර්තු මස 09 දිනැති අංක 2270/18 දරන ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කරන ලදී. එකී පනතෙහි වගන්ති අංක 20 ප්‍රකාරව එම 2022 අංක 05 දරන රෙගුලාසි, 2022 මාර්තු මස 21 දිනැති අංක 22/0484/304/037 දරන අමාත්‍යමණ්ඩල සංදේශයට ලද අනුමැතියද සහිතව මාසයක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. කෙසේවෙතත්, එම රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා සභාගත කරන ලෙස ඉල්ලා පාර්ලිමේන්තුවේ සභානායක ලේකම් වෙත යවන ලිපිය අත්සන් කිරීමට පෙර එවකට මුදල් අමාත්‍යවරයා ඇතුළු අමාත්‍ය මණ්ඩලය ඉල්ලා අස්වීම හේතුවෙන්, එකී රෙගුලාසි සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය මසක කාලයක් තුළ දී නොලැබුණු අතර පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව 2022 අප්‍රේල් 09 දින සිට එම රෙගුලාසි බලාත්මක නොවීය.

යථෝක්ත පසුබිම තුළ, 2022 මාර්තු මස 09 දිනැති 2022 අංක 05 දරන රෙගුලාසි මඟින් නියාමනය කරන ලද භාණ්ඩ 369 ආනයනය නියාමනය /සීමා කිරීමටත්, ඒ සඳහාවූ ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවය 2022 අප්‍රේල් මස 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි අඛණ්ඩව පවත්වාගෙන යාමටත්, 2022 අංක 06 දරන රෙගුලාසි පනවා 2022 අප්‍රේල් මස 09 දිනැති අංක 2274/42 දරන ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කරන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2278/21 – 2022.05.06– විවෘත ගිණුම් ගෙවීම් ක්‍රම,භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම,ගෙවීම් මත ලේඛන ගෙවීම් ක්‍රම සහ පිළිගැනීම් මත ලේඛන ගෙවීම් ක්‍රම නියාමනය කිරීම.**

නෛතික නොවන විදේශ විනිමය වෙළෙඳපොළ මෙහෙයුම් පුළුල් වීම මැඩලීම සහ රේගු නිෂ්කාශනයේ දී ආනයන සඳහා වටිනාකම අඩු ඉන්වොයිසි ඉදිරිපත් කිරීම වැළැක්වීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තෝරාගත් ගෙවීම් ක්‍රම,එනම් විවෘත ගිණුම් ගෙවීම් ක්‍රම,භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම භාවිතය සීමා කිරීමත් ගෙවීම් මත ලේඛන ගෙවීම් ක්‍රම සහ පිළිගැනීම් මත ලේඛන ගෙවීම් ක්‍රම නියාමනය කිරීමත් සිදු කර ඇත.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2282/21– 2022.05.31– 2022 මාර්තු 09 දිනැති 2022 අංක 05 දරන රෙගුලාසි සහ 2022 අප්‍රේල් 09 දිනැති 2022 අංක 06 දරන රෙගුලාසි අවලංගු කිරීම.**

විදේශ විනිමය පිටතට ගලා යාම අවම කිරීම සහ විදේශ විනිමය වෙළෙඳ පොළේ වැඩිවන පීඩනය ලිහිල් කිරීමේ අරමුණින් තෝරාගත් අත්‍යවශ්‍ය නොවන සහ හදිසි නොවන භාණ්ඩ 369 ක් ආනයනය සීමා කිරීම සඳහා, 2022 මාර්තු 09 දිනැති 2022 අංක 05 දරන රෙගුලාසි සහ 2022 අප්‍රේල් 09 දිනැති 2022 අංක 06 දරන රෙගුලාසි ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී.

කෙසේ වෙතත්, නියාමන ක්‍රියාමාර්ගවල සඵලතාවය, ව්‍යාපාරික ප්‍රජාව අතර පවතින සන්නිවේදන දුර්වලතා වැඩිවීම, රාජ්‍ය මූල්‍ය ආදායම පහත වැටීම, බලපත්‍ර සඳහා ඇති ඉල්ලුම වැඩිවීම සහ ලිපිලේඛන ආශ්‍රිත කටයුතු වැඩිවීම යන කරුණු සලකාබලා ආනයන පාලන බලපත්‍රවල අවශ්‍යතාවය ඉවත්කර තීරු බදු සහ අධිභාර ඉහළ දැමීමට තීරණය විය.

ඒ අනුව, 2022 ජුනි 01 දින සිට බලපැවැත්වෙන පරිදි 2022 මැයි 31 දිනැති අංක 2282/21 ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 08 දරන රෙගුලාසි මඟින් ඉහත සඳහන් කළ ආනයන පාලන රෙගුලාසි මඟින් අවලංගු කිරීම සිදු කර ඇත.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2282/22 – 2022.05.31– ගෙවීම් ක්‍රම සඳහා ආනයන පාලන රෙගුලාසි පැනවීම.**

2022 මැයි 06 දිනැති අංක 2278/21 ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා ආනයන පාලන රෙගුලාසිවලින් තෝරාගත් ගෙවීම් ක්‍රමවල එනම් විවෘත ගිණුම් ක්‍රමය භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම, ගෙවීම් මත ලේඛන සහ පිළිගැනීම මත ලේඛන ක්‍රමවල මෙහෙයුම් 2022 මැයි 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි නියාමනය කර ඇත.

කෙසේවෙතත්, අපනයන ස්ථානවල බහාලුම් සහ නැව් /ගුවන් භාණ්ඩ පහසුකම් ලබා ගැනීම සීමාසහිත වූ බැවින් නැව්ගත / ගුවන්ගත භාණ්ඩ ගණනාවක් 2022 මැයි 20 දින හෝ ඊට පෙර වරාය / ගුවන්තොටුපළ වෙත ළඟා වීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණයවූ බැවින්, ඉහත ගෙවීම් යටතේ ආනයනය කරන ලද භාණ්ඩ සඳහා පහසුකම් සැළසීම සඳහා 2022 අංක 07 දරන රෙගුලාසි බලපැවැත්වෙන දිනය 2022 මැයි 20 දින සිට 2022 ජුනි 07 දින දක්වා කල් දැමීම සිදු කර ඇත.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2285/19 – 2022.06.24 – ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි සංශෝධනය කිරීම.**

2022 මැයි 06 දිනැති අංක 2278/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, දේශීය නිෂ්පාදකයින්ගේ සහ වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයාගේ 2022 ජුනි 10 දිනැති අංක 22/0800/528/002 දරන සංදේශය මත අමාත්‍ය මණ්ඩලය ලබාදුන් අනුමැතිය පරිදි අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනකරුවන්ගේ ඉල්ලීම් සමග අපනයනකරුවන් සහ වක්‍ර අපනයනකරුවන් මුහුණ දෙන පරිපාලන දුෂ්කරතා සළකා බැලීමෙන් අනතුරුව, 2022 මැයි 06 දිනැති 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි, 2022 ජුනි 24 දිනැති අංක 2285/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 10 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි මගින් සංශෝධනය කිරීම සිදු කර ඇත.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2291/44 – 2022.08.05 – ආනයන පාලන බලපත්‍රයකට යටත්ව ග්ලයිෆොසේට් ආනයනය සඳහා අවසර ලබා දීම.**

මෑත කාලයේදී, තේ හා රබර් වගාවේ වල් පැළෑටි මර්ධනය සඳහා කාර්යක්ෂමතාව අඩු සහ නිර්දේශ නොකළ විකල්ප වල්නාශක භාවිත කිරීම හේතුවෙන් දැරීමට සිදු වූ විශාල මූල්‍ය පිරිවැය අවම කරගැනීමටත්, තේ අපනයනයේදී ඇති වූ ගැටලුකාරී තත්වය වලක්වාගැනීමටත්, පොල් සහ උක් වගාවන් තුල පැතිර යන රෝග පාලනය කිරීම සඳහාත්, ග්ලයිෆොසේට්වල ආනයන අවශ්‍යතාවය මතුකරමින්, "වැවිලි ක්ෂේත්‍රයේ ග්ලයිෆොසේට්වල අවශ්‍යතාවය සපුරාලීම" යන මැයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍ය, ගරු රමේෂ් පතිරණ මහතා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ආනයන පාලන බලපත්‍රයකට යටත්ව ග්ලයිෆොසේට් ආනයනය සඳහා අවසර ලබා දීම සිදු කර ඇත.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක – 2294/29– 2022.08.23 – පවතින ආනයන පාලන රෙගුලාසීන්හි විධිවිධාන කිහිපයක් ලිහිල් කිරීම.**

රටේ පවතින ආර්ථික තත්ත්වය සළකා බැලීමෙන් අනතුරුව, රාජ්‍ය අංශයේ ආනයන සහ තෝරාගත් අංශයන්හි මෙහෙයුම් දායකත්වය සහතික කිරීම පිණිස, 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද, දැනට පවතින ආනයන පාලන රෙගුලාසීන්හි විධිවිධාන කිහිපයක් ලිහිල් කිරීම සඳහා මෙම ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක– 2294/30 –2022.08.23 – තෝරාගත් භාණ්ඩ වර්ග1,464ක් (සංයෝජිත වර්ගීකරණ අංක) ආනයනය තාවකාලිව අත්හිටුවීම.**

තෝරාගත් භාණ්ඩ වර්ග 1,464ක් (සංයෝජිත වර්ගීකරණ අංක) ආනයනය තාවකාලිව අත්හිටුවීම සඳහා, 2022 අගෝස්තු මස 23 දිනැති අංක 2294/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ රෙගුලාසි ප්‍රකාශයට පත්කරන ලදි.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක – 2296/30 –2022.09.09– ආනයනය තාවකාලික තහනම් කළ භාණ්ඩ උපලේඛනයෙන් තෝරාගත් භාණ්ඩ ඉවත් කිරීම.**

2022.08.23 දිනැති අංක 2294/30 දරන අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කිරීමත් සමඟ, සිය ව්‍යාපාරවල හා කර්මාන්තවල මෙහෙයුම් අඛණ්ඩව සිදුකර ගෙන යෑම තහවුරු කිරීම සඳහා විවිධ අන්තර්, ප්‍රාග්ධන හා නිමි භාණ්ඩ ආනයනය තාවකාලිකව අත්හිටුවීම ඉවත් කිරීමට හෝ ලිහිල් කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ආයතන, කර්මාන්ත හා වාණිජ මණ්ඩල විසින් මුදල් අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය, කර්මාන්ත අමාත්‍යාංශය හා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත සිය කරුණු ඉදිරිපත් කිරීම් සිදුකරන ලදී.

මෙම ඉල්ලීම්වල තිබූ කරුණු සම්බන්ධයෙන් අදාළ රාජ්‍ය ආයතනවලින් ද විමසා සලකා බැලීමෙන් අනතුරුව,එකී රෙගුලාසිවලින් අපේක්ෂා කළ අරමුණු සම්පූර්ණ බිඳ වැටීමකට ලක් නොකරමින් ව්‍යාපාර හා කර්මාන්ත සඳහා පහසුකම් සැලසීමට ඇතැම් නම්‍යශීලිතාවයන් ද සමඟින් ආනයනය කිරීම් තාවකාලික තහනම් කළ භාණ්ඩ උපලේඛනයෙන් තෝරාගත් භාණ්ඩ ඉවත් කිරීම සඳහා කටයුතු කරන ලදී.

**අති විශේෂ ගැසට් නිවේදන අංක – 2297/79– 2022.09.16– විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ එකී අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා 2022 සැප්තැම්බර් මස 30 දක්වා අවසර ලබාදීම.**

අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය රට තුළ ලබා ගැනීමේ හැකියාව ඉහළ නැංවීමට සහ වෙළඳපොළේ එවැනි ආහාර ද්‍රව්‍යවල හිඟය හේතුවෙන් සිල්ලර මිල ඉහළ යාම පාලනය කිරීමේ අරමුණ ඇතිව විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ එකී අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා 2022 සැප්තැම්බර් මස 30 දක්වා අවසර ලබාදීමට කටයුතු කර ඇත.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක – 2298/55 – 2022.09.23– කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ චක්‍රලේඛය යටතේ ආනයන බලපත්‍ර හිමියන්ට පූර්ණ විදුලි වාහන ආනයනය කිරීමට අවසර ලබා දීම.**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යවරයා විසින් 2022 ජූලි මස 16 දිනැති අංක 22/1028/625/001 දරන තම අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් දිරිගැන්වීමේ ක්‍රමයක් ලෙස ඔවුන් හට විදුලි වාහන ආනයනය කිරීම සඳහා වාහන ආනයන බලපත්‍රයක් ලබා දීමට 2022 අගෝස්තු මස 16 වැනි දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී.

2022 ජූනි 11 දිනැති අංක 2231/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති රෙගුලාසි මගින් ආනයනය තාවකාලිකව අත්හිටුවන ලද උපලේඛනයේ විදුලි මෝටර් වාහන ද අඩංගුව ඇති බැවින්, සංශෝධිත 2022 අගෝස්තු 31 දිනැති අංක 02/2022 දරන කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ චකලේඛය යටතේ වාහන ආනයන බලපත්‍ර හිමියන්ට ආනයනය කිරීමට හැකිවන පරිදි මෙම ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක – 2300/12 – 2022.10.05 – කෘෂි බීජ ,කෘෂි රසායන ද්‍රව්‍ය හා රසායනික පොහොර අයිතම ආනයනය කිරීමේ දී පෙර ගෙවීම් සීමාව ඇමරිකානු ඩොලර් 50,000 සිට ඇමරිකානු ඩොලර් 250,000 දක්වා වැඩි කිරීම.**

"කෘෂිකාර්මික යෙදවුම් ආනයනය කිරීම් මූල්‍යයනය කිරීම සඳහා පෙර ගෙවීම් සීමාවන් ඉහළ නැංවීම" මැයෙන් ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද

2022 සැප්තැම්බර් 12 දිනැති අංක 22/1461/604/038 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක (HS Code) 20 කට අදාළ කෘෂි බීජ, කෘෂි රසායන ද්‍රව්‍ය හා රසායනික පොහොර අයිතම 22 ක් ආනයනය කිරීමේ දී, 2012 ජනවාරි 02 දිනැති අංක 1739/3 දරන ගැසට් පත්‍රයේ අංක 06 රෙගුලාසිය අනුව දක්වා ඇති පෙර ගෙවීම් සීමාව ඇමරිකානු ඩොලර් 50,000 සිට ඇමරිකානු ඩොලර් 250,000 දක්වා වැඩි කිරීම සඳහා රෙගුලාසි පනවා 2022 ඔක්තෝම්බර් 05 දිනැති අංක 2300/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක – 2302/31 –2022.10.21– කැඩුණු (සුනු) සහල් ආනයනය කිරීමට අවසර ලබා දීම.**

වෙළඳපොළේ පවතින විදේශ විනිමය ද්‍රවශීලතාවයේ හිඟය සහ විදේශ විනිමය ගෙවීම් ක්‍රම සීමා කිරීම, විශේෂයෙන් කුකුළු ආහාර වැනි සත්ත්ව අහාර නිෂ්පාදනය සඳහා අවශ්‍යවන බඩ ඉරිඟු, සෝයා බෝංචි මාංශ සහ කැඩුණු සහල් වැනි අමුද්‍රව්‍ය ආනයනයට දැඩි ලෙස බලපා ඇති බැවින් එවැනි අමුද්‍රව්‍ය ආනයනය කිරීමට පහසුකම් සැලසීම උදෙසා "සත්ත්ව අහාර නිෂ්පාදනය සඳහා අත්‍යවශ්‍ය අමුද්‍රව්‍යයක් වන බඩඉරිඟු වල වර්තමානයේ පවතින උග්‍ර හිඟය සඳහා කඩිනම් පියවර ලබා ගැනීම "යන කෘෂිකර්ම අමාත්‍යවරයාගේ 2022 සැප්තැම්බර් 13 දිනැති අංක 22/1433/612/018 දරන සංදේශයේ යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී .

කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා ආහාර ප්‍රවර්ධන මණ්ඩලය මගින් බඩඉරිඟු, සෝයා බෝංචි මාංශ, කැඩුණු (සුනු) සහල් හෝ වෙනත් සුදුසු ධාන්‍ය වර්ග ආනයනය කිරීමට ද අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි.

බඩඉරිඟු සහ සෝයා බෝංචි මාංශ ආනයනය කිරීම සඳහා වන රෙගුලාසි දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති බැවින් අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව, අවශ්‍ය පරිදි ආහාර ප්‍රවර්ධන මණ්ඩලයට හෝ ආහාර ප්‍රවර්ධන මණ්ඩලය වෙනුවෙන් කැඩුණු සහල් ආනයනය කිරීමට අවසර ලබා දීම සඳහා රෙගුලාසි පනවා 2022 ඔක්තෝබර් 21 දිනැති අංක 2302/31 දරන ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක – 2304/04 – 2022.10.31 – විවෘත ගිණුම් ක්‍රමය යටතේ 2022 දෙසැම්බර් 31 දක්වා කිරිඟු පිටි ආනයනය කිරීමට අවසර ලබා දීම.**

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයාගේ ‘‘අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයීමේ වත්මන් තත්ත්වය’’ යන මැයෙන් 2022 අගෝස්තු 19 දිනැති අංක 22/1260/627/007 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, කිරිඟු පිටි ඇතුළු තෝරාගත් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය විවෘත ගිණුම්/භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යටතේ 2022 සැප්තැම්බර් 30 දක්වා ආනයනය කිරීම සඳහා 2022 සැප්තැම්බර් 16 දිනැති අංක 2297/79 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි මගින් අවසර දෙන ලදී.

කෙසේ වෙතත්, ඉන්දියාව තම දේශීය ඉල්ලුම සපුරාලීම වෙනුවෙන් කිරිඟු පිටි අපනයනය තහනම් කිරීමට තීරණය කිරීමත් සමඟ දේශීය අවශ්‍යතා සඳහා කිරිඟු පිටි ආනයනය කිරීම දුෂ්කර වී ඇති අතර අඩු ආදායම්ලාභී පවුල්වලට දරාගත නොහැකි තරමට කිරිඟු පිටිවල වෙළඳපළ මිල ඉහළ යන ලදී.මෙම පසුබිම තුළ, පාරිභෝගිකයින්ට දැරිය හැකි මිලකට දේශීය වෙළඳපොළේ කිරිඟු පිටි ලබා ගැනීම සඳහා විවෘත ගිණුම් ක්‍රමය යටතේ තුර්කිය සහ ඩුබායි යන රටවල් වලින් කිරිඟු පිටි ආනයනය කිරීමට තීරණය විය.වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයාගේ 2022 ඔක්තෝබර් 10 දිනැති අංක

22/1589/627/007-I දරන සංදේශයට ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත විවෘත ගිණුම් ක්‍රමය යටතේ 2022 දෙසැම්බර් 31 දක්වා තිරිඟු පිටි ආනයනය කිරීමට අවසර ලබා දෙන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක – 2304/05 – 2022.10.31 – ගුවන් යානා නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් සහ උපාංග ජාත්‍යන්තර ගුවන් සේවා සපයන්නන්ට ආනයන බලපත්‍රයක් රහිතව ආනයනය කිරීමට අවසර ලබා දීම.**

කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත පැමිණෙන තම ගුවන් යානා නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් සහ උපාංග රේගු නිෂ්කාශනය කිරීමේදී වසර ගණනාවක් මුළුල්ලේ අඛණ්ඩව දුෂ්කරතාවන්ට මුහුණ දෙන බව ජාත්‍යන්තර ගුවන් සේවා ක්‍රියාකරුවන් වරින්වර වාර්තා කරන ලදී.එය ජාත්‍යන්තර ගුවන් සේවා ක්‍රියාකරුවන් අතර ශ්‍රී ලංකාව පිළිබඳ අයහපත් ප්‍රතිරූපයක් ඇති කිරීමට හේතු වන අතර කලාපයේ ගුවන් කේන්ද්‍රස්ථානය ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්තියටද පටහැනි වේ .ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන, ජාත්‍යන්තර ගුවන් සේවා සපයන්නන්ට පහසුකම් සැලසීම සඳහා ඉහත ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක – 2307/12 – 2022.11.23 – ආනයනය තාවකාලිකව අත්හිටුවන ලද උපලේඛනයෙන් තෝරාගත් භාණ්ඩ ඉවත් කිරීම.**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරිපත් කළ යෝජනාවට අනුව, විදේශ විනිමය හා විදේශ සංචිත මත වැඩිවෙමින් පැවති පීඩනය අඩුකිරීම සහ බාධාවකින් තොරව අත්‍යවශ්‍ය ආනයනික භාණ්ඩවල අඛණ්ඩ සැපයුමක් ලබාදීම සඳහා බැංකු පද්ධතිය තුළ පවතින සීමිත විදේශ විනිමය ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීමයන අරමුණු ඇතිව, 2022 අගෝස්තු 23 දිනැති අංක 2294/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් තෝරාගත් භාණ්ඩවර්ග ආනයනය තාවකාලිකව අත්හිටුවන ලදී.

කෙසේවෙතත්, සිය ව්‍යාපාරවල හා කර්මාන්තවල මෙහෙයුම් අඛණ්ඩව සිදුකර ගෙන යෑම තහවුරු කිරීම සඳහා විවිධ අන්තර්, ප්‍රාග්ධන හා නිමි භාණ්ඩ ආනයනය තාවකාලිකව අත්හිටුවීම ඉවත් කිරීමට හෝ ලිහිල් කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය සහ පුද්ගලික ආයතන යන දෙපාර්ශ්වයම විසින් සිදු කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගැනීමෙන් පසුව, තෝරාගත් භාණ්ඩ තාවකාලික තහනම් කළ භාණ්ඩ උපලේඛනයෙන් ඉවත් කිරීමසිදු කරන ලදී.

ඒ අනුව, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 62 ක් තාවකාලික තහනම් කළ භාණ්ඩ උපලේඛනයෙන් ඉවත් කිරීමට සහ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 15 ක් යටතේ වර්ග කර ඇති රූපලාවන්‍ය අයිතම රාජ්‍ය ආයතනවල නිර්දේශය මත අවස්ථානුකූලව ආනයනය කිරීමට අවසර ලබාදීම සඳහා විධිවිධාන සලසමින් මෙම ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක – 2308/26– 2022.12.01 – බඩ ඉරිඟු සහ සෝයා බෝංචි ආහාර, විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනය කිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම.**

කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය බඩ ඉරිඟු සහ සෝයා බෝංචි ආහාර, විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ 2022 ඔක්තෝම්බර් 31 දක්වා ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

ඉහත කී කාලසීමාව අවසන් වීමෙන් පසුව කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් එම කාලසීමාව 2022 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කිරීමට මෙම ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක – 2309/40– 2022.12.09– සහල් අනයනය නැවත දැනුම් දෙන තුරු අත්හිටුවනු ලබන ආනයන පාලන බලපත්‍ර ක්‍රමය යටතට ගෙන ඒම.**

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව ඉදිරි වසර සඳහා ප්‍රමාණවත් සහල් තොගයක් රට තුළ පවතින බැවින්,සංයෝජිත වර්ගීකරණ සංකේත 1006.30.19 සහ 1006.30.29 යටතේ වර්ග කරන ලද සහල්, නැවත දැනුම් දෙන තුරු ආනයනය අත්හිටුවීම සඳහා මෙම ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක – 2311/08 –2022.12.19 – තෝරාගත් භාණ්ඩ තාවකාලික අත්හිටුවීමේ උපලේඛනයෙන් ඉවත්කිරීම.**

ශ්‍රී ලංකා මහ බැංකුවේ යෝජනාවට අනුව, විදේශ විනිමය අර්බුදයට සහනයක් ලෙස, 2022 අගෝස්තු 23 දිනැති අංක 2294/30 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි මගින් තෝරාගත් භාණ්ඩ ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවීමේ උපලේඛනයට ඇතුළත් කරන ලදී.

කෙසේවෙතත්, පුද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතනවල ඉල්ලීම් සලකා බලා, ක්‍රීඩා, සංචාරක, මහජන ආරක්ෂාව සහ පරිසරය ආදිය ආවරණය වන පරිදි සංයෝජිත වර්ගීකරණ සංකේත 10ක් යටතේ වර්ගීකරණය කරන ලද තෝරාගත් භාණ්ඩ තාවකාලික අත්හිටුවීමේ උපලේඛනයෙන් ඉවත් කිරීම සිදු කරන ලදී.

**අතිවිශේෂ ගැසට් නිවේදන අංක – 2311/18–2022.12.21– රසායනික පොහොර මාස හයක (06) කාලයක් සඳහා විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය යටතේ ආනයනය කිරීමට අවසර ලබාදීම, කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය බඩඉරිඟු ආනයනය කිරීමට අවසර ලබා දීම සහ ග්ලයිෆොසේට් ආනයනය සඳහා අත්තිකාරම් ගෙවීමේ සීමාව ඇමෙරිකානු ඩොලර් 250,000 දක්වා වැඩි කිරීම.**

රසායනික පොහොරවල උපයෝජ්‍යතාවය සහතික කිරීමේ අරමුණින් බෝග සඳහා අවශ්‍ය රසායනික පොහොර මාස හයක (06) කාලයක් සඳහා විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය යටතේ ආනයනය කිරීමට අවසර ලබා දෙන ලදී.

තවද, කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය බඩඉරිඟු ආනයනය කිරීමට අවසර ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී.

තවද, කෘෂි බීජ, කෘෂි රසායන සහ රසායනික පොහොර ආනයනය සඳහා අත්තිකාරම් ගෙවීමේ සීමාව ඇමෙරිකානු ඩොලර් 250,000 දක්වා වැඩි කරන ලද අතර එම ගැසට් නිවේදනයට ඇතුළත් නොකරන ලද වල් නාශකයක් වන ග්ලයිෆොසේට් ඊට ඇතුළත් කිරීමට තීරණය කරන ලදී.ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන උක්ත ප්‍රතිපත්තිමය තීරණ බලාත්මක කිරීම උදෙසා මෙම ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී.

### 2.1.2 මෙහෙයුම් උපදෙස් හා අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම.

දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ ප්‍රකාශිත ගැසට් නිවේදනයන්හි ඇතුළත් රෙගුලාසි පිළිබඳව ශ්‍රී ලංකා රේගුව, සියලුම වාණිජ බැංකු හා දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දැනුම්වත්භාවය ඉතා වැදගත් වේ.

ගැසට්පත්‍රයක් ප්‍රකාශයට පත් කරන සැමවිටම ඊට අදාළව මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම හා අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමකි. ඒ අනුව, 2022 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් උපදෙස් 21 ක් හා අභ්‍යන්තර චක්‍රලේඛ 24 ක් නිකුත් කිරීමට පියවර ගෙන ඇත.

## 2.2 ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන නියාමන ප්‍රතිපත්තිය දියුණු කිරීම.

ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන ප්‍රතිපත්ති නියාමනය කිරීමේ හා එම ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීමේ ප්‍රධානතම ආයතනය ලෙස ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය තුළ දී සිදුකරන ලද කාර්යභාරය පහත පරිදි වේ.

### 2.2.1 ආනයන (ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන) නියෝග

උසස් ප්‍රමිතියකින් හා ඉහළ ගුණාත්මකභාවයකින් යුක්ත ආනයනික භාණ්ඩ භාවිත කිරීමට රටේ පාරිභෝගිකයින්ට අවස්ථාව ලබා දීම සඳහා ආනයනික භාණ්ඩ ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූල වීම අනිවාර්ය කරමින් හා යාවත්කාලීන කරමින් ආනයන (ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන) ගැසට් නිවේදන කලින්කලට නිකුත් කරනු ලැබේ. ඒ අනුව, දැනට ක්‍රියාත්මකව පවතින 2018 මාර්තු මස 29 දිනැති අංක 2064/34 දරන ආනයන (ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන) අතිවිශේෂ ගැසට් නිවේදනය සංශෝධනය කිරීමේ අවශ්‍යතාව දෙපාර්තමේන්තුව විසින් හඳුනාගනිමින් ඒ සඳහා අදාළ ක්‍රියාමාර්ග මේ වන විටත් ගෙන ඇත.

එලෙස ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලයන්ට අනුකූල විය යුතු ආනයනික අයිතම කිහිපයක් හඳුනාගෙන හා අදාළ පාර්ශ්වයන්ගේ අදහස් හා යෝජනා ලබා ගෙන ඇත. ඒ අනුව, ඉදිරිපත් වී ඇති සියලු යෝජනා ගැසට් නිවේදනයේ ඇතුළත් කිරීම සඳහා ඇති හැකියාව පිළිබඳව අදාළ රාජ්‍ය ආයතන, වාණිජ මණ්ඩල හා වාණිජ බැංකු සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගැසට් නිවේදනය කෙටුම්පත් කිරීමේ කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර, ඉදිරියේදී එය ප්‍රකාශයට පත්කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

### 2.2.2 එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1540 දරන යෝජනාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා 1540 ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය 2019 සැප්තැම්බර් මස 11 දින අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දෙන ලදී. එම අනුමැතිය අනුව, මෙම 1540 දරන යෝජනා වඩා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නීති සම්පාදන කමිටුව සහ තාක්ෂණ කමිටුව වශයෙන් රාජ්‍ය ආයතනවලින් සැදුම්ලත් කමිටු ද්විත්වයක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හරහා පත් කර ඇත.

එම නීති සම්පාදන කමිටුව මඟින් අංක 1540 දරන යෝජනාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීති කෙටුම්පත් කරන අතර මේ වන විට උපායමාර්ගික වෙළඳ කළමනාකරණ පනත කෙටුම්පත් කර ඇති අතර එය කමිටුවේ සිටින විශේෂඥ දැනුමක් ඇති අය සමග සාකච්ඡා කරමින් පවතී.

ජාතික උපායමාර්ගික අපනයන පාලන ලැයිස්තුව සකස් කිරීම සඳහා තාක්ෂණික කමිටුව විසින් යුරෝපීය සංගම් ද්විභාවිත භාණ්ඩ ලැයිස්තුව සහ යුරෝපීය සංගම් යුධඅවි ලැයිස්තුව භාෂාත්‍රයෙන් පරිවර්තනය කර ඇත.

### 2.2.3 පූර්ව නැව්ගත කිරීමේ පරීක්ෂණ සහතිකය (Pre-Shipment Inspection Certificate)

පාවිච්චිකළ වාහන ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේ දී වාහන නියමිත වායු විමෝචන ප්‍රමිතීන් සහ ආරක්ෂක මිනුම් ප්‍රමිතිවලට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණයකට ඉදිරිපත් කළ යුතු බැවින් ඒ සඳහා පූර්ව නැව්ගත කිරීමේ පරීක්ෂණ සහතිකය ලබාගත යුතු බලයලත් පරීක්ෂණ ආයතන

ඇතුළත්කර 2013 අප්‍රේල් මස 04 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත්කර ඇත.

එම ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර ඇති පරීක්ෂණ ආයතන මඟින් පමණක් පූර්ව නැව්ගත කිරීමේ පරීක්ෂණ සහතිකය ලබාගත යුතු වීම මත ඒකරාශී වී ඇති ඒකාධිකාරය හේතුවෙන් සේවා සැපයීමේ දී ඇතිවන දුෂ්කරතාවයන් සැලකිල්ලට ගෙන තම සේවාලාභීන් වෙත වඩා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීමේ අරමුණින් බලයලත් පරීක්ෂණ ආයතන සංඛ්‍යාව වැඩිකිරීමේ අවශ්‍යතාවයක් ඇති විය. ඒ අනුව, තාක්ෂණික ඇගයුම් කමිටුවක් හරහා එම කාර්යය සිදුකිරීමට දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය කටයුතු සලසා ඇත.

මේ වන විට බලයලත් පරීක්ෂණ ආයතන සංඛ්‍යාව වැඩිකිරීම සඳහා අවශ්‍ය ගැසට් නිවේදනය කෙටුම්පත් කර ඇති අතර බලයලත් පරීක්ෂණ ආයතන කිහිපයක් සම්බන්ධයෙන් තවදුරටත් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකෙරෙමින් පවතී.

ඒ අනුව, මෙම ගැසට් නිවේදනය ප්‍රකාශයට පත්කිරීම තුළින් ඉදිරියේදී ආනයනකරුවන්ට වාහන ආනයනයේ දී මුහුණපෑමට සිදුවන දුෂ්කරතා අවම කරගැනීමට හා ඒවා මිලදී ගන්නා පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව තහවුරු කරගැනීමටත් ඉඩකඩ සැලසෙනු ඇති බව සඳහන් කළ හැකිය.

### 2.2.4 ආනයන හා අපනයන වෙළෙඳාම සඳහා පහසුකම් සැපයීම.

### 2.2.4.1 පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය (Citizen's Charter)

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන සේවාවන් සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවෙන් සේවාවන් ලබා ගැනීමට අපේක්ෂිත සේවා ලාභීන් දැනුවත් කිරීම සඳහා මෙම පුරවැසි සේවා ලාභී ප්‍රඥප්තිය මෙම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට ඇතුළත් කර ඇත.

තව ද, මෙම දෙපාර්තමේන්තුවේ ඒ ඒ අංශ හා ඒකක මඟින් කෙරෙනු ලබන කාර්යයන්, ඒ සඳහා අවශ්‍ය කරන ලේඛන හා ඊට ගතවන කාලය ආදිය පැහැදිලිව දක්වමින් මාර්ගෝපදේශයන් සඳහන් කර ඇති අතර, ඕනෑම අයෙකුට එම මාර්ගෝපදේශයන් අපගේ වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිවේ.

### 2.2.4.2 අසාධුගත ලේඛනය (Blacklist)

රටේ ආරක්ෂාව, මහජන සෞඛ්‍යය හා සුරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම සඳහා ආනයන හා අපනයන පාලන රෙගුලාසි මඟින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූල නොවන ලෙස භාණ්ඩ අනයනය කරන ආනයනකරුවන්ගේ ලේඛනයක් ප්‍රසිද්ධියට පත් කිරීමට ආනයන හා අපනයන පාලන පනතේ විධිවිධාන සලසා ඇත. ඒ අනුව, එවැනි ආනයනකරුවන් ප්‍රසිද්ධියට පත් කිරීමේ ක්‍රමවේදය ඇතුළත් රෙගුලාසි ත්‍රෛභාෂාවෙන් කෙටුම්පත් කර නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධව එම දෙපාර්තමේන්තුව ලබා දෙන නිරීක්ෂණ මත පදනම්ව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.එසේම රජයේ ගිණුම් කාරක සභාවේ ඉල්ලීම මත එම අසාධුගත ලේඛනයට ඇතුළත් ආයතන වල ව්‍යාපාර සහතිකය අවලංගු කිරීම සම්බන්ධව කරන ලද ඉල්ලීමට අනුව අප දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ඉල්ලා ලිපියක් යොමුකර ඇත.

### 2.2.4.3 මාර්ගෝපදේශ සංග්‍රහය යාවත්කාලීන කිරීම (Updating the Guideline)

දෙපාර්තමේන්තුව මඟින් ඉටුකරනු ලබන කාර්යයන් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව සිදුකිරීමට මාර්ගෝපදේශ සංග්‍රහය ඉවහල් වේ. විශේෂයෙන්ම දෙපාර්තමේන්තුවේ සේවයට අනුයුක්ත කරනු ලබන නවක නිලධාරින්හට මෙවැනි මාර්ගෝපදේශ සංග්‍රහයකින් රාජකාරී ඉටුකිරීමට අදාළ වන දැනුම ලබාගත හැකි වේ.

එබැවින්, මීට වසර ගණනාවකට පෙර සකස් කර ප්‍රකාශයට පත්කර ඇති මාර්ගෝපදේශ සංග්‍රහය වර්තමානයේ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කර ඇති ගැසට් නිවේදන මඟින් පනවා ඇති නීති රෙගුලාසි හා නිකුත් කර ඇති මෙහෙයුම් උපදෙස් හා අභ්‍යන්තර චක්‍රලේඛ පදනම් කරගෙන කාලීන අවශ්‍යතාවලට අනුව යාවත්කාලීන කිරීම සිදුකළ යුතු බව හඳුනාගන්නා ලදී.

2022 වර්ෂයේදි දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ගේ පරිහරණය සඳහා උක්ත යාවත්කාලීන කිරීම් සිදුකර මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාශයට පත් කරන ලදී.

### 2.2.4.4 ආනයන හා අපනයන අනුමැතීන් ලබාදීමේදී නිර්දේශ ලබාදිය යුතු ආයතන හඳුනාගැනීම (Recommending Authorities)

2022 වර්ෂයේ මුල් භාගයේ දී මෙම නිර්දේශ දෙනු ලබන ආයතන සම්බන්ධයෙන් ඉතා වැදගත් අත්පොතක් මෙම දෙපාර්තමේන්තුව විසින් සකසා ආනයන හා අපනයන පාලක ජනරාල් වෙත පිළිගන්වන ලදී.

මෙහි දී 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ ප්‍රසිද්ධ කොට ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි අනුව ආනයන හා අපනයන පාලන බලපත්‍ර පාලනයට යටත් අයිතම සඳහා ආනයන හෝ අපනයන බලපත්‍රයක් ලබා දීමට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත අදාළ රාජ්‍ය ආයතනයන් මඟින් නිකුත් කරන නිර්දේශයන් ලබා ගෙන අයදුම්කරු විසින් තම අයදුම්පත්‍රය ලබා දිය යුතුයි.

මෙම කාර්යයභාරය සේවාලාභීන් සහ අභ්‍යන්තර නිලධාරීන්ටද පහසු හා වේගවත් කිරීමේ ක්‍රමවේදයක් ලෙස අදාළ නිර්දේශ ලබාගත යුතු රාජ්‍ය අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු/මණ්ඩල හෝ සංස්ථා හෝ ආයතන ඉතා ක්‍රමවත්ව හා විධිමත්ව සම්පින්ඩණය කර ඇත.

ඒ නිසා මෙමඟින් වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් අපගේ සේවාලාභීන්ට මෙන් ම අභ්‍යන්තර නිලධාරීන්ට ද ප්‍රයෝජනවත් හා මනාව අවබෝධ කර ගත හැකි බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

### 2.2.4.5 ඒකාබද්ධ සංයෝජිත වර්ගීකරණය සංකේතාංක ලැයිස්තුව (Consolidated Control List)

1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ රෙගුලාසි මගින් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන භාණ්ඩ ප්‍රධාන වශයෙන් ආනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම (ICL), එලෙස බලපත්‍ර පාලනයට යටත් අයිතමයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවීම (SL), ආනයනය තහනම් කිරීම (B), සහ ආනයනය තාවකාලික ව අත්හිටුවීම (TS) යන ක්‍රමවේද ඔස්සේ නියාමනය කිරීම සිදු කර ඇත.

මෙහිදී, වරින් වර අතිවිශේෂ ගැසට් පත්‍රයන් ප්‍රකාශයට පත් කිරීම මඟින් මෙම කර්තව්‍ය සිදු කර ඇති අතර ඒ හේතුවෙන් යම් භාණ්ඩයක් ආනයනය කිරීමට අපේක්ෂිත පුද්ගලයෙකු එම භාණ්ඩය වත්මන් රෙගුලාසි යටතේ ආනයනය කළ හැකි ද යන ගැටලුව මූලික ව පැන නගිනු ඇත.

එම ගැටලුව නිරාකරණය කර ගැනීමේ අපේක්ෂාවෙන් එම සියලු ගැසට් පත්‍රයන්ගේ සාරාංශය එක් කර ගත් එක් ඒකාබද්ධ ලේඛනයක් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති අතර එමගින් යම් භාණ්ඩයක සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය (HS Code) දන්නේ නම්, ඒම සංකේතාංකය නිවැරදි ව ඇතුළත් කිරීමෙන් ඊට අදාළ ආනයන රෙගුලාසිය පහසුවෙන් දැන ගැනීමේ හැකියාව පවතී.

එමගින් අභ්‍යන්තර නිලධාරීන්ට ද තම සේවාලාභීන්ගේ අවශ්‍යතා කඩිනමින් ඉටු කිරීමට අවස්ථාව ද උදා වී ඇත.

### 2.2.4.6 සේවාවන් මාර්ගගත ක්‍රමයට ක්‍රියාත්මක කිරීම.

මේ වන විට සේවාලාභීන්ට අන්තර්ජාලය භාවිත කරමින් මෙම දෙපාර්තමේන්තුවේ මාර්ගගත ක්‍රමය ඔස්සේ ආනයනය හා අපනයනය සඳහා පාලන බලපත්‍ර ලබා දීමට අවශ්‍ය අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට හා ඒ තුළ ලියාපදිංචි වීමට අවස්ථාව සකසා ඇති අතර,බලපත්‍ර සඳහා ගෙවීම් සිදු කිරීමට අංශය ඊ-ගෙවීම් ක්‍රමවේදයද මේ වන විට සකසා ඇත.

එහි දී අදාළ ගෙවීම් කිරීම සඳහා ප්‍රධාන බැංකු දෙකක් (02) හරහා ඊ-ගෙවීමේ ක්‍රමය හරහා ආනයනකරුවන්ට හෝ අපනයනකරුවන්ට විද්‍යුත් ගෙවීම් ක්‍රමවේදය ඔස්සේ ගෙවීම් කටයුතු සලසා ඇත.

එමෙන්ම, දැනට වරායන් සඳහා ළඟාවන භාණ්ඩයන් සඳහා පමණක් අනුමත කිරීමේ ක්‍රමවේදයක් මෙම දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති අතර, නුදුරේ දී ගුවන්තොටුපොළ සඳහා ද මෙය ව්‍යාප්ත කිරීමේ සාකච්ඡා මේ වන විට ආරම්භ කර ඇති අතර, විද්‍යුත් ක්‍රමවේදය ඔස්සේ ගෙවීම් කිරීමට ද (E-Payment) ඉහත බැංකුවලට අමතර ව තවත් බැංකු හඳුනාගෙන ගෙවීම් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

එසේම, මෙම දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් ආනයන පාලන බලපත්‍ර වලට අනුකූලව මෙරටට අදාළ භාණ්ඩ ගෙන්වූ පසු ආනයනකරුවන් විසින් ආනයන ලේඛන රේගු නිෂ්කාශන ප්‍රකාශන සමඟ මෙම දෙපාර්ත මේන්තුව වෙත ඉදිරිපත් කර හර කිරීම් (Debit) ක්‍රියාදාමය සඳහා භාරදිය යුතුය. එලෙස හර කරන ලද පාලන බලපත්‍ර පිළිබඳව ශ්‍රී ලංකා රේගුවට මාර්ගතව පරීක්ෂා කිරීමට හැකිවන පරිදි දැනට පවත්නා අපගේ මාර්ගත පද්ධතිය සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. එමඟින් ආනයන කරුවන් විසින් ව්‍යාජ ලිපිලේඛන ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කිරීමට ඇති ඉඩකඩද අහුරා යනු ඇත.

## 2.3 ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීම

ආනයන හා අපනයන කටයුතු නියාමනය කරනු ලබන ආයතනයක් ලෙස මෙම දෙපාර්තමේන්තුව ආනයන හා අපනයන පාලන බලපත්‍රයට යටත් කරන ලද අයිතම සඳහා බලපත්‍ර නිකුත් කිරීම මෙයින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යය වේ. ඒ අනුව, එකී කාර්යය විධිමත්ව හා ඵලදායිව සිදු කරමින් සේවාලාභීන් වෙත ගුණාත්මක සේවාවක් ලබා දීමට මෙම දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇති ඒකක 5ක් යටතේ බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි.

එසේම 2022.08.23 දිනැති අංක 2294/30 දරන අති විශේෂ ගැසට්පත්‍රය මඟින් තෝරාගත් භාණ්ඩ ආනයනය කිරීම තාවකාලිකව තහනම් කරන ලද අතර, එම ගැසට් පත්‍රය සංශෝධනය කරමින් 2022.09.09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කරන ලදී. එම ගැසට් පත්‍රයේ උපලේඛන "අ" මඟින් දක්වා ඇති භාණ්ඩ සඳහා වූ ආනයන තහනම ඉවත් කරන ලද අතර තෝරාගත් ආනයනකරුවන් සඳහා ආනයන තහනමට ලක්වූ භාණ්ඩ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය /මුදල් අමාත්‍යාංශය ලේකම්ගේ නිර්දේශය/විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය/කර්මාන්ත අමාත්‍යාංශය ලේකම්ගේ නිර්දේශය/ ධීවර අමාත්‍යාංශය ලේකම්ගේ නිර්දේශය/අදාළ රේඛීය අමාත්‍යාංශය ලේකම්ගේ නිර්දේශය මත අවස්ථානුකූලව ආනයනය කිරීමට පහසුකම් සලසන ලදී.


**2.3.1 ඒකක 01- ඖෂධ හා ශෛල්‍ය උපකරණ**

මෙම ඒකකය මගින් ඖෂධ හා ශෛල්‍ය උපකරණ වර්ග කාණ්ඩ **6**ක් යටතේ වර්ගීකරණය කර බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදුකරන අතර, 2022 වර්ෂයේදී එක්එක් කාණ්ඩය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පහත පරිදි වේ.

| අංකය | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | බටහිර ඖෂධ | 400 | 1,249 |
| 2 | පශු ඖෂධ | 410 | 249 |
| 3 | ආයුර්වේද ඖෂධ | 420 | 239 |
| 4 | හෝමියෝපති ඖෂධ | 430 | 11 |
| 5 | ශල්‍ය මැහුම් තන්තු | 450 | 33 |
| 6 | රූපලාවන්‍ය උපකරණ | 460 | 51 |
| **එකතුව** | | | **1,832** |

මෙහිදී ඖෂධවල ජීව කාලය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් විශේෂ අවධානයක් යොමුකරන අතර, ඖෂධ සඳහා අවම ජීව කාලයක් පැවතීම අනිවාර්යය වේ. එසේ නොමැති ඖෂධ සම්බන්ධයෙන් නිර්දේශ ලබාගත යුතු ආයතන පිළිබඳව ද පැහැදිලිව හඳුන්වා දීමට කටයුතු කර ඇත.

**ඖෂධ හා ශෛල්‍ය උපකරණ සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව**




### 2.3.2 ඒකක 2 - පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස්

මෙම ඒකකය මඟින් පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදුකරනු ලබන අතර 2022 වර්ෂයට අදාළව පහත පරිදි බලපත්‍ර නිකුත් කර ඇත.

| | විස්තරය | බාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | තානාපති කාර්යාල විසින් ආනයන කරනු ලබන වාහන | 130 | 1 |
| 2 | සමාජ සේවා ආයතන සඳහා පරිත්‍යාග | 150 | 5 |
| 3 | විශේෂ කාර්ය යන්ත්‍රසූත්‍ර | 180 | 1 |
| 4 | මෝටර් ට්‍රේලර් (පාවිච්චි කළ) | 185 | 2 |
| 5 | කෘෂිකාර්මික අංශය සඳහා වන පාවිච්චි කළ ට්‍රැක්ටර් | 190 | 1 |
| 6 | ගුවන් යානා සහ හෙලිකොප්ටර් අමතර කොටස් | 210 | 107 |
| 7 | එන්ජින් | 220 | 7 |
| 8 | යන්ත්‍ර සහ උපාංග | 225 | 1 |
| 9 | බොඩි ෂෙල් | 230 | 21 |
| 10 | කැබින් | 235 | 1 |
| 11 | පාවිච්චි කළ මෝටර් බයිසිකල් | 240 | 1 |
| 12 | ඉලෙක්ට්‍රික්මෝටර් බයිසිකල් | 242 | 173 |
| 13 | මෝටර් බයිසිකල් | 244 | 59 |
| 14 | හෙල්මට් | 245 | 17 |
| 15 | වාහන අමතර කොටස් (Cut Portion) | 280 | 2 |
| 16 | රබර් වලින් නිම කළ භාණ්ඩ | 286 | 31 |
| 17 | පාවහන් | 287 | 34 |
| 18 | හිස්වැසුම් සහ අනෙකුත් හිස් ආවරණ | 288 | 5 |
| 19 | වැසි | 290 | 20 |
| 20 | වීදුරු භාණ්ඩ | 310 | 11 |
| 21 | ආසන (පාවිච්චි කළ වාහන ආසන) | 320 | 2 |
| 22 | ආසන හා ලෝහ ගෘහ භාණ්ඩ | 321 | 52 |
| 23 | තෙත් පිස්නා සහ ඉටිපන්දම් | 325 | 2 |
| 24 | වීදුරු භාණ්ඩ උපාංග | 330 | 18 |
| 25 | ඉවුම් පිහුම් උපකරණ | 335 | 17 |
| 26 | යකඩ හෝ වානේ ගෘහ භාණ්ඩ | 340 | 16 |
| 27 | සනීපාරක්ෂක උපකරණ සහ යකඩ හෝ වානේ කොටස් | 350 | 12 |
| 28 | ඇලුමිනියම් වලින් කරන ලද ගෘහ භාණ්ඩ | 360 | 6 |
| 29 | අනෙකුත් මේස උපකරණ | 365 | 3 |
| 30 | නීච ලෝහයෙන් කරන ලද භාණ්ඩ | 370 | 6 |
| 31 | අච් කණ්නාඩි | 375 | 2 |
| 32 | අත් ඔරලෝසු සහ ඔරලෝසු | 380 | 7 |
| 33 | සංගීත භාණ්ඩ | 385 | 4 |
| **එකතුව** | | | **647** |

**පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව**





2022.09.09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව රාජ්‍ය ආයතන/රජයේ අරමුදල් යටතේ කරනු ලබන ව්‍යාපෘති සඳහා භාණ්ඩ ආනයනය යටතේ සහ අංක 2231/18 දරන 2021.06.11 දිනැතිව නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ රෙගුලාසි වලින් ආවරණය නොවන භාණ්ඩ ආනයනය යන ආනයන කාණ්ඩයන් සඳහා අනුමැතීන් 52 ක් ලබාදී ඇත.

### 2.3.3 ඒකක 3 - රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය

ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය සඳහා 2022 වර්ෂය තුළ නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | රසායනික ද්‍රව්‍ය හා කෘමිනාශක | 500 | 424 |
| 2 | ලුණු | 505 | 25 |
| 3 | ඛනිජ තෙල් නිෂ්පාදන | 510 | 940 |
| 4 | සීනි | 515 | 3 |
| 5 | කෘෂි රසායනික හැර අනෙකුත් රසායනික ද්‍රව්‍ය | 520 | 1,721 |
| 6 | රසායනික පොහොර | 525 | 11 |
| 7 | විකිරණශීලී ද්‍රව්‍ය | 530 | 236 |
| 8 | මද්‍යසාර | 540 | 224 |
| 9 | මත්පැන් සහ දුම්කොළ නිෂ්පාදන | 545 | 85 |
| **එකතුව** | | | **3,669** |

**රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය සඳහා නිකුත් කළ බලපත්‍ර**





2022.09.09 දිනැති අංක 2296/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව ධීවර කටයුතු සම්බන්ධ යන්ත්‍රෝපකරණ හෝ කොටස් ආනයනය යන ආනයන කාණ්ඩය යටතේ අනුමැතීන් 2ක් ලබා දී ඇත.

**2.3.4 ඒකක 4 - ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ**

2022 වර්ෂයේදී ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ සඳහා පහත පරිදි ආනයන බලපත්‍ර නිකුත් කර ඇත.

| | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ජංගම දුරකථන (පාවිච්චි කළ /අලුත්) | 615 | 2,191 |
| 2 | සන්නිවේදන උපකරණ | 620 | 1,145 |
| 3 | පරිගණක | 625 | 5 |
| 4 | පාවිච්චි කළ වායුසමීකරණ, පාවිච්චි කළ ශීතකරණ සහ අධි ශීතකරණ | 630 | 2 |
| 5 | තාප පොම්ප | 631 | 7 |
| 6 | ඉවත දමන ශීතකරණ වායු සිලින්ඩර | 640 | 76 |
| 7 | අලුත් ඉලෙක්ට්‍රොනික අයිතම | 645 | 136 |
| 8 | විදුලි පේනු සහ කෙවෙනි | 655 | 61 |
| 9 | දුරස්ථ පාලකයකින් ක්‍රියා කරන සෙල්ලම් බඩු | 660 | 52 |
| 10 | මුද්‍රණ යන්ත්‍ර සහ ඡායා පිටපත් යන්ත්‍ර | 690 | 59 |
| 11 | බෑග් | 905 | 13 |
| 12 | ඇඟලුම් | 910 | 5 |
| 13 | කෘතිම ලොම් සහ ලී භාණ්ඩ | 915 | 8 |
| 14 | බුමුතුරුණු | 920 | 6 |
| 15 | විදුලි පංකා | 925 | 57 |
| 16 | වායු සමීකරණ යන්ත්‍ර | 930 | 37 |
| 17 | ශීතකරණ හා අධිශීතකරණ | 935 | 29 |
| 18 | රෙදි සෝදන යන්ත්‍ර | 940 | 13 |
| 19 | විදුලි උපකරණ | 945 | 127 |
| 20 | දුරකථන කට්ටල | 950 | 8 |
| 21 | විදුලි සංදේශ උපකරණ | 955 | 8 |
| 22 | මොනිටර සහ ප්‍රොජෙක්ටර් | 960 | 46 |
| 23 | විදුලි සංදේශ උපකරණවල කොටස් | 965 | 9 |
| 24 | විදුලි කෙඳි හෝ විසර්ජන ලාම්පු | 970 | 44 |
| 25 | ලාම්පු සහ ආලෝක උපාංග | 980 | 80 |
| 26 | ඩිජිටල් කැමරා සහ වීඩියෝ කැමරා රෙකෝඩර | 985 | 7 |
| **එකතුව** | | | **4,231** |

**ජංගම දුරකථන හා සන්නිවේදන උපකරණ සඳහා නිකුත් කළ බලපත්‍ර**





2022.09.09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය කිරීම යන ආනයන කාණ්ඩය යටතේ අනුමැතීන් 47ක් ලබා දී ඇත.

### 2.3.5 ඒකක 5- වෙනත් ආනයන සහ අපනයන

වෙනත් ආනයන හා අපනයන සඳහා පහත පරිදි බලපත්‍ර නිකුත් කර ඇත.

| | විස්තරය | කාණ්ඩය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|
| ආනයන පාලන බලපත්‍ර | | | |
| 1 | සතුන් සහ සත්ත්ව නිෂ්පාදන | 550 | 1,674 |
| 2 | ශීතකළ මසුන් | 555 | 128 |
| 3 | ශීතකළ ඇල්ලන් | 556 | 3 |
| 4 | ධාන්‍ය වර්ග | 570 | 154 |
| 5 | සහල් (කැකුළු සහල් / තැම්බූ සහල්) | 572 | 86 |
| 6 | ශක්තිජනක පාන | 575 | 50 |
| 7 | තේ | 580 | 406 |
| 8 | පුපුරන ද්‍රව්‍ය හා ගිනි අවි | 600 | 109 |
| 9 | ක්‍රීඩා භාණ්ඩ | 650 | 1 |
| 10 | දුම්වැටි කොළ | 670 | 73 |
| 11 | පාවිච්චි කළ ලී බඩු | 680 | 3 |
| 12 | කියත් | 685 | 33 |
| 13 | ලෝහ කැබලි , සුන්බුන් සහ වෙනත් | 715 | 145 |
| 14 | පාවිච්චි කළ ඇඳුම් | 720 | 1 |
| 15 | කාබනික අපද්‍රව්‍ය | 735 | 73 |
| 16 | පාම් ඔලේන් හා පාම් ස්ටියරීන් | 750 | 57 |
| 17 | රත්‍රං | 760 | 39 |
| 19 | කටු ගැලවූ මසුන් | 800 | 1 |
| 20 | කිරි ආශ්‍රිත නිෂ්පාදන | 805 | 29 |
| 21 | පළතුරු | 810 | 38 |
| 22 | සකස්කළ පිටි වර්ග හා මෝල්ට් | 815 | 18 |
| 23 | චොකලට් | 820 | 17 |
| 24 | පැස්ටා | 825 | 10 |
| 25 | පළතුරු යුෂ | 830 | 18 |
| 26 | ජලය සහ මධ්‍යසාර නොවන පාන වර්ග | 835 | 4 |
| 27 | ඇඳුම් ආයිත්තම් සහ තිර රෙදි | 840 | 81 |
| 28 | තොප්පි හා හිස්වැසුම් | 850 | 1 |
| 29 | කුඩ | 855 | 1 |
| 30 | සෙල්ලම් බඩු | 870 | 2 |
| 31 | විනෝදාස්වාදය සඳහා වන භාණ්ඩ | 875 | 3 |
| අපනයන පාලන බලපත්‍ර | | | |
| 32 | ඉරන ලද දැව කොටස් | 602 | 8 |
| 33 | අබලි ලෝහ සුන්බුන් | 710 | 177 |
| එකතුව | | | **3,443** |

**වෙනත් ආනයන සහ අපනයන සඳහා නිකුත් කළ බලපත්‍ර**





2022.09.09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ජාත්‍යන්තර ආහාර හා පාන දාමයන්ගේ වරලත් ක්‍රියාකරුවන් භාණ්ඩ ආනයනය කිරීම යන ආනයන කාණ්ඩය යටතේ අනුමැතීන් 5ක් ලබා දී ඇත.

### 2.3.6 2022 වර්ෂයේ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලනබලපත්‍ර -මාසිකව

| මාසය | ඖෂධ | වාහන | රසායනික ද්‍රව්‍ය | සන්නිවේදන උපකරණ | වෙනත් ආනයන හා අපනයන | එකතුව |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 226 | 13 | 340 | 520 | 240 | 1,339 |
| පෙබරවාරි | 197 | 19 | 386 | 431 | 312 | 1,345 |
| මාර්තු | 153 | 17 | 344 | 385 | 333 | 1,232 |
| අප්‍රේල් | 128 | 96 | 281 | 427 | 310 | 1,242 |
| මැයි | 97 | 166 | 197 | 423 | 187 | 1,070 |
| ජූනි | 134 | 12 | 234 | 274 | 217 | 871 |
| ජූලි | 102 | 11 | 307 | 198 | 208 | 826 |
| අගෝස්තු | 181 | 16 | 350 | 250 | 297 | 1,094 |
| සැප්තැම්බර් | 144 | 34 | 344 | 365 | 282 | 1,169 |
| ඔක්තෝබර් | 125 | 68 | 327 | 373 | 265 | 1,158 |
| නොවැම්බර් | 175 | 137 | 265 | 349 | 411 | 1,337 |
| දෙසැම්බර් | 170 | 58 | 278 | 236 | 381 | 1,123 |
| **එකතුව** | 1,832 | 647 | 3,653 | 4,231 | 3,443 | 13,806 |

**2021 හා 2022 වර්ෂයේ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර -මාසිකව**




## 2.3.7 පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර සංඛ්‍යාව

පසුගිය වසර 5 තුළ එක් එක් ඒකකය මඟින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පහත පරිදි වේ.

| | අයිතමය | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|
| ඒකක 01 | ඖෂධ | 2,293 | 2,489 | 2,594 | 2,255 | 1,832 |
| ඒකක 02 | වාහන | 740 | 518 | 197 | 284 | 647 |
| ඒකක 03 | රසායනික ද්‍රව්‍ය | 3,718 | 3,948 | 3,956 | 4,313 | 3,653 |
| ඒකක 04 | සන්නිවේදන උපකරණ | 4,310 | 5,241 | 5,083 | 8,982 | 4,231 |
| ඒකක 05 | වෙනත් ආනයන සහ අපනයන | 4,714 | 4,888 | 4,299 | 3,742 | 3,443 |
| | එකතුව | **15,775** | **17,084** | **16,129** | **19,576** | **13,806** |

**පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර සංඛ්‍යාව**



## 2.4 පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය

### 2.4.1 ඖෂධ හා ශෛලය උපකරණ - ඒකක 1

රට තුළ ව්‍යාප්ත වූ කොවිඩ් අවදානමත් සමඟ මුව ආවරණ සඳහා බලපත්‍ර නිකුත් කිරීම හේතුවෙන් 2021 වර්ෂයේ දී බටහිර ඖෂධ කාණ්ඩය යටතේ විශාල බලපත්‍ර ප්‍රමාණයක් නිකුත් විය. නමුත් ක්‍රමක්‍රමයෙන් ශ්‍රී ලංකාව තුළ මුව ආවරණ නිෂ්පාදනය ආරම්භ වීමත් සමග ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීම අඩුවීම හේතුවෙන් 2022 වර්ෂයේ බටහිර ඖෂධ කාණ්ඩය යටතේ බලපත්‍ර නිකුත් කිරීමේ අඩුවීමක් දක්නට ලැබුණි.

2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණය සුළු ප්‍රමාණයකින් පහළ ගොස් ඇත. සමස්තයක් ලෙස පෙර වර්ෂයට (2021) සාපේක්ෂව මෙම වසරේ ඒකක 01 හි බලපත්‍ර නිකුත් කිරීමෙහි 18.8% ක පහළ යාමක් පෙන්නුම් කරයි.පසුගිය වසර 5 ක කාලය තුළ නිකුත් කරන බලපත්‍රවලට අදාළ දත්ත විශ්ලේෂණය කර බැලීමේ දී අඩුම බලපත්‍ර සංඛ්‍යාවක් නිකුත් කරන ලද වර්ෂය ලෙස 2022 වර්ෂය හැඳින්විය හැකිය.

### 2.4.2 පාවිච්චි කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් - ඒකක 2

කොවිඩ් -19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේ විනිමය අනුපාතය මත වූ පීඩනය අවම කිරීම උදෙසා සහ දේශීය කර්මාන්ත නංවාලීම සඳහා වාහන හා අමතර කොටස් ආනයන තාවකාලිකව අත්හිටුවීමට දෙපාර්තමේන්තුව විසින් රෙගුලාසි ප්‍රකාශයට පත්කිරීම හේතුවෙන් 2020 වර්ෂයේදි මෙම ඒකකය මඟින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාවෙහි විශාල අඩුවීමක් දක්නට ඇත. එනමුත් දේශීයව වාහන එකලස් කිරීමේ කර්මාන්ත නඟා සිටුවීම උදෙසා අමුද්‍රව්‍ය ආනයනය කිරීමට බලපත්‍ර ලබා දීම 2021 වසරේ දී සිදු කරන ලද අතර ඒ හේතුවෙන් 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ දී බලපත්‍ර වැඩි ප්‍රමාණයක් නිකුත් කර ඇත. කෙසේවෙතත් 2022 මාර්තු මස 09වන දින අංක 2270/18 දරන ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කිරීමත් සහ 2022.08.**23** දිනැති 2294/2**9** දරන ගැසට් පත්‍රය මඟින් විද්‍යුත් මෝටර් බයිසිකල් සහ පාපැදි ආනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම සිදුකිරීමත් සමඟ 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂය සඳහා වැඩි බලපත්‍ර සංඛ්‍යාවක් නිකුත් කර ඇත.

### 2.4.3 රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය - ඒකක 3

පසුගිය වසර 5 තුළ රසායනික ද්‍රව්‍ය සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාවේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරයි. 2021 වර්ෂයේදී රසායනික පොහොර, පලිබෝධ නාශක හා වල්නාශක ආනයනය තහනම් කිරීමට රජය ගත් ප්‍රතිපත්තිමය තීරණය මත, එම අයිතම යටතේ ගැනෙන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක කිහිපයක් ආනයන බලපත්‍ර පාලනයට යටත් කරන ලද අතර අනෙකුත් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ආනයනය තහනමට ලක් කරන ලදී. එලෙස බලපත්‍ර පාලනයට යටත් කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ කර්මාන්ත සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ආනයනය වන බැවින් කර්මාන්ත ක්ෂේත්‍රය බිඳවැටීමකට ලක් නොවී පවත්වාගෙන යාම උදෙසා එකී අමුද්‍රව්‍ය ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කරන ලද අතර එමනිසා 2021 වර්ෂයේ නිකුත් වූ බලපත්‍ර ප්‍රමාණය අනෙක් වර්ෂ 4 ට සාපේක්ෂව ඉහල අගයක පවතී.

ඉහත සඳහන් කරන ලද රසායනික පොහොර, පලිබෝධ නාශක හා වල්නාශක යන අයිතම සඳහා පනවා තිබූ බලපත්‍ර පාලනය ඉවත් කළ බැවින් 2022 වර්ෂයේ නිකුත් වූ බලපත්‍ර ප්‍රමාණය සුළු ප්‍රමාණයකින් පහළ ගොස් ඇත.සමස්තයක් ලෙස පෙර වසරට (2021) සාපේක්ෂව මෙම වසරේ ඒකක 3 හි බලපත්‍ර නිකුත් කිරීමෙහි 15.3% ක පහල යාමක් පෙන්නුම් කරයි.

### 2.4.4 ජංගම දූරකථන හා සන්නිවේදන උපකරණ - ඒකක 4

2022 වර්ෂයේ කාණ්ඩ 29 ක් යටතේ බලපත්‍ර 4231 ක් නිකුත් කර ඇත. අංක 2022 වර්ෂයේ මාර්තු මස 09 දිනැති අංක 2270/18 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් තාවකාලිකව බලපත්‍ර පාලනයට නතුකරනු ලැබූ කාණ්ඩ 17 ක් යටතේ වර්ගීකරණය කළ භාණ්ඩ වර්ග කිහිපයක් සඳහා ඉන් බලපත්‍ර 497ක් නිකුත් කර ඇති අතර ඉතිරි ප්‍රමාණය වූ බලපත්‍ර 3734 ක් නිකුත් කර ඇත්තේ ඒකකය මගින් බලපත්‍ර නිකුත් කරනු ලබන ඊට පෙර වර්ෂ වලද පැවති කාණ්ඩ ඒකක 12 සඳහාය.

2021 වර්ෂයේදි ඒකක 04 මගින් බලපත්‍ර 8982 ක් නිකුත් කර ඇත. එම අගය හා සැසඳීමේදී 2022 වර්ෂය තුළ නිකුත් කරන ලද මුළු බලපත්‍ර සංඛ්‍යාවේ විශාල අඩුවීමක් පෙන්නුම් කරනු ලැබේ. ප්‍රතිශතයක් ලෙස එය 53% අඩුවීමක් ලෙස පෙන්වාදිය හැකිය.

ඊට හේතුවූ කරුණු කිහිපයක් වේ.

* 2020 සහ 2021 වර්ෂවලදී කොවිඩ් වසංගතය විශාල ලෙස රට පුරා පැතිරී ගිය අතර රජයේ පාසල් ඇතුළු සියළුම අධ්‍යාපන ආයතන තම අධ්‍යයන කටයුතු මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබාදෙන ලදි. එහිදි ජංගම දූරකථන භාවිතය විශාල වශයෙන් ඉහළ ගිය අතර වාණිජ අරමුණෙන් ආනයනය කරනු ලැබූ ආයතනයන් විසින් විශාල බලපත්‍ර සංඛ්‍යාවක් ලබාගන්නා ලදි. තවද පිටරටවල පදිංචි ඥාතීන් විසින් ත්‍යාග වශයෙන් එවන ලද ජංගම දූරකථන මෙන්ම පෞද්ගලිකව මුදල් ගෙවා ආනයනය කර ගත් ජංගම දූරකථන සඳහාද නිකුත් කළ බලපත්‍ර ප්‍රමාණය ඉහළ යන ලදී. එහෙත් 2022 දී කොවිඩ් තත්ත්වය සමනය වීමත් සමගම අධ්‍යාපන කටයුතු පුරුදු පරිදි ආරම්භ විය. එමනිසා ජංගම දූරකථන භාවිතය සඳහා වූ අධි ඉල්ලුමද පහත වැටුණි.
* විනිමය අනුපාත ඉහළයාමත් සමගම ආනයනික භාණ්ඩවල රුපියල් අගය විශාල ලෙස වැඩිවූ අතර එලෙස මිල ඉහළ යාම නිසාම ජංගම දූරකථන සඳහා පැවති ඉල්ලුම අඩුවූ අතර ආනයනය ද සීමා විය.
* රටතුළ පවතින ආර්ථික අවපාතය හේතුවෙන් ඇතිවූ විදේශ විනිමය හිඟය ආනයන සීමා කිරීමට සෘජුවම බලපෑ අතර ජංගම දූරකථන ආනයනයට එය බලපාන ලදි.
* රජය විසින් වරින්වර ගෙවීම් ක්‍රම සංශෝධනය කරනු ලැබූ අතර විවෘත ගිණුම් ක්‍රමය යටතේ භාණ්ඩ ආනයනය සීමාකරනු ලැබීය. එවැනි මූල්‍යමය රෙගුලාසි ක්‍රියාත්මක වීම තුළ ආනයන අඩුවූ අතර ජංගම දූරකථන ආනයනය අඩුවීම සඳහාද එය හේතුවිය.

2021 වර්ෂයේදී ජංගම දූරකථන ආනයනයට ලබාදුන් බලපත්‍ර සංඛ්‍යාව 6918 ක් වූ අතර 2022 දී එය 2191 ක් විය. එය 68.5% ක අඩුවීමක් පෙන්නුම් කරන අතර 2022 වර්ෂයේදී ඒකකය විසින් නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණය අඩුවීමට බලපෑ ප්‍රධාන සාධකය එය විය.

සමස්තය සලකා බැලීමේදී ඒකක 04 මගින් නිකුත් කරන ලද මුළු බලපත්‍ර ප්‍රමාණය 2021 වර්ෂයට සාපේක්ෂව විශාල වශයෙන් පහළ ගොස් ඇති අතර රටේ පවතින ආර්ථික අවපාතය සහ ආනයන සීමා කිරීමට අදාළ මූල්‍ය රෙගුලාසි ද එයට බලපා ඇති බව මූලිකව නිරීක්ෂණය වේ. ඊට අමතරව ආනයන පාලන රෙගුලාසි හඳුන්වාදීමෙන් ද උද්ධමනකාරි වාතාවරණය තුළ භාණ්ඩවල මිල ඉහළ යාම හේතුවෙන් ඉල්ලුමේ ඇතිවූ සංකෝචනයට සාපේක්ෂව සැපයුමේ අඩුවීමත් ඊට හේතු වූ බව පෙන්වා දිය හැකිය

### 2.4.5 වෙනත් ආනයන සහ අපනයන - ඒකක 5

2022 වර්ෂය සළකා බැලීමේදි ඒකක 5 මගින් ආනයන සඳහා බලපත්‍ර 3258 ක් හා අපනයන සඳහා අපනයන බලපත්‍ර 185 ක් නිකුත් කර ඇත.

2021 වර්ෂය හා සැසඳීමේදී සත්ත්ව ආහාර ආනයනය සඳහා විවෘත ගිණුම් ක්‍රමය යටතේ ගෙවීම් කිරීමට අවසර ලබා දෙමින් අංක 2297/79 හා 2022.09.16 දිනැතිව ප්‍රකාශයට පත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව පෙර වර්ෂයට වඩා 100% බලපත්‍ර සංඛ්‍යාවේ වර්ධනයක් දක්නට ඇත.

අංක 2309/40 හා 2022.12.09 වන දින ප්‍රකාශයට පත් කරන ලද අති විශේෂ ගැසට් නිවේදනය මගින් සහල් ආනයනය බලපත්‍ර පාලනයට පත් කිරීම සමග පාලනයට ලක් කර දින වන විට නැව්ගත කරන ලද සහල් තොග නිදහස් කිරීම සඳහා 2022.12.31 දින වන විට ආනයන බලපත්‍ර 86 ක් නිකුත් කරන ලද අතර එමගින් බලපත්‍ර ගාස්තු සහ අමතර ගාස්තු ලෙස රුපියල් මිලියන 20 කට අධික මුදලක් අය වී ඇත.

2021 වර්ෂයේදී ශක්තිජනක පාන සඳහා ආනයන බලපත්‍ර 114 නිකුත් කර ඇතත් එය 2022 වර්ෂයේදී බලපත්‍ර 50 දක්වා අඩු වී ඇති අතර 2022 .09.09 දිනැතිව ප්‍රකාශයට පත්කරන ලද 2296/30 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ශක්තිජනක පාන සඳහා බලපත්‍ර නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවීම එයට හේතු වී ඇත.

දැව් තෙල් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම 2021 වර්ෂයේ ජුනි මාසයේ සිට නවතා දමන ලද අතර එම ආනයන කටයුතු ශ්‍රී ලංකා රේගුව වෙත මෙහෙයුම් උපදෙස් මගින් අධීක්ෂණය සඳහා පැවරුණු අතර 2021 වර්ෂයේ ලබාදුන් ආනයන බලපත්‍ර සංඛ්‍යාව 256 වුවත් 2022 වර්ෂයේ කිසිදු ආනයන බලපත්‍රයක් නිකුත් කර නැත.

මෙරට විදේශ විනිමය සංචිත 2022 වර්ෂයේ ශීඝ්‍රයෙන් පහත යාම නිසා ඇමරිකානු ඩොලරය හමුවේ රුපියලේ අගය විශාල වශයෙන් පහළ යාමක් දක්නට ලැබුණු අතර එහි අහිතකර ප්‍රතිඵල අවම කිරීම සඳහා අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ රාශියක් ආනයන බලපත්‍ර පාලනයට ලක් කිරීම සිදු කරන ලද අතර කාණ්ඩ වර්ග 14 ක් යටතේ නව ආනයන බලපත්‍ර 222 ක් නිකුත් කිරීම සිදු කරන ලදී.

සමස්තයක් ලෙස රටෙහි ආර්ථික වර්ධනය සෘණ අගයක් වාර්තා කළ අතර ආර්ථික කටයුතු සංකෝචනය වීම නිසා ආනයන බලපත්‍ර සංඛ්‍යාව විශාල වශයෙන් අඩු අගයක් දක්වා පහළ බැසිය යුතු වුවත් ආනයන වියදම් පාලනය සඳහා නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් නිවේදන මගින් නව භාණ්ඩ බලපත්‍ර පාලනයට එක් වීම නිසා ඒකක 5 මගින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 2021 වර්ෂයට සාපේක්ෂව බලපත්‍ර 3742 සිට 3443 දක්වා 2022 වර්ෂයේදි සුළු පසුබෑමක් වාර්තා වි ඇත.

## 2.5 ආනයන හා අපනයන ගෙවීම් ක්‍රම සහ නියෝග

වාණිජ අරමුණින් සිදුකරනු ලබන ජාත්‍යන්තර වෙළඳ ගනුදෙනු නියාමනය කිරීමද දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි. ඒ වෙනුවෙන් විදේශ වෙළඳ ගෙවීම් ක්‍රම අති විශේෂ ගැසට් පත්‍රයක් ප්‍රසිද්ධියට පත්කර ඇති අතර, එම ගෙවීම් ක්‍රම පහත සඳහන් වේ. මෙම ගෙවීම් ක්‍රම සම්බන්ධයෙන් වාණිජ බැංකු වෙත මෙහෙයුම් උපදෙස් නිරන්තරයෙන් නිකුත් කරනු ලැබේ.

1. පෙර ගෙවීම් (Advanced Payments)
2. පිළිගැනීම මත ලේඛන (Documents against Acceptance - DA)
3. ණයවර ලිපි (Letters of Credit - LC)
4. ගෙවීම් මත ලේඛන (Documents against Payment)
5. විවෘත ගිණුම් (Open Accounts - OA)
6. භාණ්ඩ විකුණුන මුදල් ගෙවීමේ පදනම (Payments on Consignment Account Basis)

ඉහත සඳහන් ගෙවීම් ක්‍රමවලට අදාළ රෙගුලාසිවලට අනුකූල වන ලෙස භාණ්ඩ ආනයනය කර නොමැති අවස්ථාවලදී හෝ ගෙවීම් කර නොමැති විට දී එම භාණ්ඩ ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කිරීමට සහ ආනයනයට අදාළ ගෙවීම් කිරීමට ඊට අදාළ කරුණු සැලකිල්ලට ගෙන ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දෙනු ලැබේ. ඒ අනුව, එලෙස 2022 වර්ෂයේ දී ලබාදුන් අනුමැතීන් පහත පරිදි වේ.

| **2022 වර්ෂයේ දී ප්‍රතිපත්ති අංශය විසින් ලබාදෙන ලද අනුමැතීන්** | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| මාසය | අනුමැතීන් වර්ග | | | | | | | | |
| | පෞර ගෙවීම | විදේශ විනිමය වැය නොවන පදනම මත ආනයනයන් | ණයගැනීම මත ලේඛන සඳහා වන ගෙවීම | විවෘත ගිණුම මත ගෙවීම | පුනි අපනයන | ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්ත වලින් ඉවතලන ද්‍රව්‍ය දේශීය වෙළඳපොළට නිකුත් කිරීම | විද්‍යුත් ප්‍රේෂණ සහ ණයවර ලිපි මත ගෙවීම | වෙනත් | මුළු එකතුව |
| ජනවාරි | 11 | 342 | 51 | 21 | 4 | 5 | 14 | 0 | 448 |
| පෙබරවාරි | 17 | 304 | 57 | 22 | 6 | 2 | 34 | 1 | 443 |
| මාර්තු | 14 | 352 | 58 | 33 | 5 | 2 | 23 | 1 | 488 |
| අප්‍රේල් | 14 | 219 | 18 | 21 | 5 | 3 | 22 | 0 | 302 |
| මැයි | 21 | 342 | 15 | 22 | 4 | 0 | 45 | 2 | 451 |
| ජුනි | 18 | 431 | 33 | 15 | 0 | 3 | 54 | 1 | 555 |
| ජුලි | 9 | 267 | 39 | 5 | 5 | 1 | 68 | 1 | 395 |
| අගෝස්තු | 10 | 285 | 59 | 31 | 12 | 5 | 141 | 59 | 602 |
| සැප්තැම්බර් | 9 | 350 | 137 | 30 | 2 | 1 | 180 | 5 | 714 |
| ඔක්තොම්බර් | 4 | 214 | 54 | 11 | 0 | 0 | 159 | 9 | 451 |
| නොවැම්බර් | 11 | 218 | 66 | 63 | 0 | 0 | 229 | 16 | 603 |
| දෙසැම්බර් | 15 | 200 | 71 | 63 | 0 | 0 | 196 | 9 | 554 |
| **මුළු එකතුව** | **153** | **3524** | **658** | **337** | **43** | **22** | **1165** | **104** | **6006** |

ඉහත සඳහන් අනුමැතීන් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති අංශය විසින් දෛනිකව කාර්යසාධන වාර්තාවක් පවත්වාගෙන යාම සඳහා නිලධාරියෙකු පත්කළ අතර එහිදී දෛනිකව සේවාලාභින් විසින් ප්‍රතිපත්ති අංශය වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර අතරින් ලබා දුන් අනුමැතීන් සම්බන්ධයෙන් යාවත්කාලීන වාර්තාවක් පවත්වාගෙන යන ලදී.

එසේම 2022.09.09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අමු ද්‍රව්‍ය හෝ අතරමැදි භාණ්ඩ ආනයනය කිරීම සහ ඉන්දියානු ණය ක්‍රමය යටතේ භාණ්ඩ ආනයනය කිරීම යන ආනයන කාණ්ඩය යටතේ අනුමැතීන් 48ක් ලබා දී ඇත.

## 2.6 විමර්ශන කවුළුව

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත්කරන ලද නීතිරීති රෙගුලාසීන් පිළිබඳ තොරතුරු හා ගැටළු නිරාකරණය කිරීම සඳහා අභිනවයෙන් විමර්ශන කවුළුවක් ස්ථාපිත කරන ලදී.

එම විමර්ශන කවුළුව හරහා දුරකථන මාර්ගයෙන් හෝ පැමිණෙන සේවාදායකයින්ට අවශ්‍ය වන ආකාරයෙන් ඔවුනගේ ගැටලු විසඳා ගැනීමට සහ නිසි මාර්ගෝපදේශයක් ලබා දීමට කටයුතු කරන ලදී. එනිසා සේවා ලාභීන් දුරස්ථව සිට වුවද ආනයන පාලන රෙගුලාසි පිළිබඳව මනා ලෙස පැහැදිලි කරගන්නා ලදී. විශේෂයෙන් ම වරින් වර තාවකාලිකව තහනම් කරමින් නිකුත් කරන ආනයන සීමා කිරීම් පිළිබඳව තොරතුරු මෙම කවුළුව හරහා ලබා දෙන ලදී. එය දෙපාර්තමේන්තුව තැබූ ඉතා ප්‍රශස්ත ඉදිරි පියවරක් බව සඳහන් කළ යුතුය.

# 3 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධන

## 3.1 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන්වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එස්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2022 රු. | | සටහන | සතය 2022 රු. | 2021 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | 3,086,778,408 | 2,934,678,721 | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| 3,000,000,000 | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | 3,086,778,408 | 2,934,678,721 | |
| | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| 3,000,000,000 | මුළු ආදායම් ලැබීම් (අ) | | 3,086,778,408 | 2,934,678,721 | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | - | - | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 667,098 | 6,028,850 | ඒසීඒ-4 |
| 2,500,000 | අත්තිකාරම් ගිණුම් | | 5,432,858 | 7,860,955 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | 3,020,191 | - | |
| 2,500,000 | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 9,120,147 | 13,889,805 | |
| 3,002,500,000 | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 3,095,898,555 | 2,948,568,526 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 2,969,634,125 | 2,852,328,152 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 126,264,430 | 96,240,374 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | | - | |
| 63,357,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 62,904,496 | 53,072,395 | ඒසීඒ-2(ii) |
| 43,870,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 42,719,921 | 26,570,407 | |
| 928,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 926,294 | 932,998 | |
| - | පොලී ගෙවීම් | 8 | - | | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | | |
| 108,155,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 106,550,711 | 80,575,800 | |
| | මූලධන වියදම් | | | | |
| 9,900,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 9,388,366 | 1,086,547 | ඒසීඒ-2(ii) |
| 21,775,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 540,610 | 6,614,500 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම | 12 | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 575,000 | හැකියා වර්ධනය | 14 | 554,208 | 348,689 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | | |
| 32,250,000 | මුළු මූලධන වියදම් (උ) | | 10,483,184 | 8,049,736 | |
| | තැන්පතු ගෙවීම් | | 612,808 | 3,058,700 | ඒසීඒ-4 |
| 4,000,000 | අත්තිකාරම් ගෙවීම් | | 6,094,286 | 9,674,302 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | 2,857,862 | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 9,564,956 | 12,733,002 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 126,598,851 | 101,358,538 | |
| 4,000,000 | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (334,421) | (5,118,164) | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | (334,421) | (5,118,164) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | | - | ඒසීඒ-3 |

1

## 3.2 2022දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 50,312,218 | 43,050,038 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 15,855,418 | 15,193,990 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | | - |
| **මුළු වත්කම්** | | **66,167,636** | **58,244,028** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 12,638,799 | 12,193,990 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 50,312,218 | 43,050,038 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 3,054,291 | 3,000,000 |
| වැටුප් පාලන ගිණුම | | 162,328 | |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | | - |
| **මුළු වගකීම්** | | **66,167,636** | **58,244,028** |

පිටු අංක 07 සිට 54 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 55 සිට 64 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තගර්ත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධමර්වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාතර්ාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්‍ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2023.02. 28 | දිනය : 2023.02. 22 | දිනය : 2023.02. 22. |

කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01

ටී.ටී. උපුල්මලී ප්‍රේමතිලක
ආනයන හා අපනයන පාලක ජනරාල්
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
කොළඹ 01.

අයි. පී. කොතලාවල
ප්‍රධාන ගණකාධිකාරි
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
කොළඹ 01.

2

## 3.3 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ACA-3

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| මුළු බදු ලැබීම් | | - | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | 3,086,778,408 | 2,934,678,721 |
| ලාභ | | - | |
| ආදායම් නොවන ලැබීම් | | 3,899,360 | 3,103,419 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | - | |
| අග්‍රිම ලැබීම් | | - | |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 6,428,435 | 4,054,546 |
| තැන්පතු ලැබීම් | | 667,098 | 6,028,850 |
| වැටුප් පාලන ගිණුමට ලැබීම් | | 3,020,191 | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **3,100,793,492** | **2,947,865,536** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 104,670,459 | 79,151,062 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 926,294 | 932,998 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 5,514,444 | 140,000 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 2,969,634,125 | 2,852,328,152 |
| අත්තිකාරම් ගෙවීම් | | 6,094,316 | 4,204,888 |
| වැටුප් පාලන ගිණුමෙන් ගෙවීම් | | 2,857,862 | |
| තැන්පතු ගෙවීම් | | 612,808 | 3,058,700 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **3,090,310,308** | **2,939,815,800** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | | **10,483,184** | **8,049,736** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | | 10,483,184 | 8,049,736 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **10,483,184** | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | | **(10,483,184)** | **(8,049,736)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)** | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | - | - |

3

## 3.4 ආදායම් එකතු කිරීමේ කාර්යසාධන


රු. '000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 10.01.03.00 | ආනයන හා අපනයන බලපත්‍ර සහ අතිරේක ගාස්තු | 2,900,000 | 3,000,000 | 3,086,778 | 102.9 |

## 3.4.1 පසුගිය වර්ෂ 4ක ආනයන හා අපනයන පාලන බලපත්‍ර සහ අතිරේක ගාස්තුවල වටිනාකම

රු. '000

| වර්ෂය | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|
| ශුද්ධ ආදායම | 1,542,977 | 2,025,978 | 2,934,679 | 3,086,778 |




දෙපාර්තමේන්තුවේ පසුගිය වසර 4 ක බලපත්‍ර ආදායම පිළිබඳව සලකා බැලීමේදී ආදායමේ ක්‍රමික වැඩිවීමක් දක්නට ලැබේ. 2022 වර්ෂයේ බලපත්‍ර නිකුත් කිරීමෙන් රුපියල් බිලියන 3.09 ක් වැනි ඉහළ ආදායමක් ඉපයීමට සමත් වී ඇති අතර එය 2021 වර්ෂය සමග සසඳා බැලීමේ දී 5% ක පමණ වැඩිවීමකි.තවද ආනයන පාලන රෙගුලාසි උල්ලංඝනය කරන ලද අවස්ථා වලදී අතිරේක ගාස්තු අයකිරීම ද සිදුකරන ලදී.

### 3.5 2022 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. '000

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 105,355 | 108,155 | 106,550.71 | 98.5 |
| ප්‍රාග්ධන | 32,250 | 32,250 | 10,483.18 | 32.5 |

2021 වර්ෂය සමග සැසඳීමේ දී 2022 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් උපයෝගී කරගනු ලැබූ අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස සලකා බැලීමේ දී පෙර වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන වියදම්වල 2.5% ක වැඩිවීමක් ද ප්‍රාග්ධන වියදම්වල 31.5% ක ප්‍රමාණයකින් අඩු වීමක් ද දක්නට ඇත.

### 3.6 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරනලද ප්‍රතිපාදන නොමැත.

### 3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. '000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2022 දිනට මූලය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | - | 49,222 | | |
| 9153 | ඉඩම් | - | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | 1,090 | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | | | |

## 3.8 විගණකාධිපතිවරයගේ වාර්තාව


**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. PUR/A/IECD/2022/FA/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2023 මැයි 25 දින.


ආනයන හා අපනයන පාලන ජනරාල්,

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 25 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේදී ආදායම් සංකේත අංක 1001-0-3-0-0-0 බලපත්‍ර ආදායම් සඳහා මූලික ඇස්තමේන්තුව රු.2,900,000,000 ක් වූ අතර සංශෝධිත ඇස්තමේන්තුව රු.3,000,000,000ක් වීමෙන් රු. 100,000,000 ක විචලතාවයක් නිරීක්ෂණය වූ අතර එය මූලික ඇස්තමේන්තුවෙන් සියයට 3.4 ක විචලතාවයකි. එබැවින් මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු පුරෝකථනය කිරීමේ අවශ්‍යතාව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

### 2.2 වියදම් කළමනාකරණය

#### 2.2.1 පුනරාවර්තන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම්හි වැය විෂයයන් 05 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 15 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් විය .

(ආ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයයන් 02 ක මූලික ඇස්තමේන්තු හා සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර සියයට 25 සිට සියයට 96 ක් දක්වා වූ පරාසයක විචලතාවයක් විය. ඒ අනුව මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී පසුගිය වර්ෂයන්හි වියදම් පිළිබඳ සමාලෝචනයක් සිදු කර හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පුරෝකථනය කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී අවධාරණය කෙරේ.

#### 2.2.2 මූලධන වියදම්

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූලධන වැය විෂයයන් දෙකක ප්‍රතිපාදන මු.රෙ. 66/69 වීරමොං ක්‍රියාපටිපාටිය මගින් වෙනස් කර තිබුණි. ඒ හේතුවෙන් එම වැය විෂයයන් දෙකෙහි මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු අතර විචලතාවය සියයට 130 ක් සහ සියයට 3950 ක් බැගින් විය. ඒ අනුව මූලික ඇස්තමේන්තු සකස් කිරීමේ දී පසුගිය වර්ෂයන්හි වියදම් පිළිබද සමාලෝචනයක් සිදුකර හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පුරෝකථනය කිරීමට කටයුතු කර නොතිබුණි .

### 2.2.3 අත්තිකාරම් ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට නිලධාරීන් 05 දෙනෙකුගේ එකතුව රු.872,216 ක ආපදා ණය ශේෂයකට අදාළ ලිපි ගොනු පරීක්ෂාවේදී ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.3 වගන්තිය අනුව විශ්‍රාම ගැනීමට පෙර මුළු ණය ආපසු ගෙවා අවසන් කරන බවට හෝ විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී තම විශ්‍රාම වැටුප පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට නැතහොත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය දෙන බවට අත්සන් කරන ලිපිය සහ 158 වැනි පොදු ආකෘති පත්‍රය ලිපිගොනුවල ඇතුළත්ව නොතිබුණි.

(ආ) නිලධාරීන් දෙදෙනෙකුගේ රු.75,840 ක සහ රු.41,800 ක දේපල ණය ශේෂ සාමාජික ණය ලේඛණයේ (CC 10 ලේඛණය) ඇතුළත් කර නොතිබුණි.

### 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු අතර එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව වුවද, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 ජුනි 20 දිනැති අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනතේ 11 ඊ වගන්තිය | ප්‍රමිතියට පටහැනිව ආනයන සිදු කරන ආනයනකරුවන් ගැසට් පත්‍ර මගින් ප්‍රකාශයට පත් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එපරදි කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ viii වැනි පරිච්ඡේදයේ 2.1 වගන්තිය | අතිකාල වැඩ පාලනය සඳහා නිසි පරීක්ෂණ හා වාර්ථා තබා ගැනීමේ ක්‍රමයක් සකස් කර ගැනීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වගකීමක් වුවද, සමාලෝචිත වර්ෂයේ දී රු.271,276 ක් අතිකාල වශයෙන් ගෙවා තිබුණ ද, එම වියදම් අධීක්ෂණය හා පාලනය කිරීම සඳහා අතිකාල ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>---------------------------------<br>මු.රෙ. 110 (1) | දෙපාර්තමේන්තුව විසින් හානි පිළිබඳ වාර්තා කරනු ලැබුවා වූ හෝ නොකරනු ලැබුවා වූ හෝ අත්තිකාරම් ගිණුම්වල හානි සහ වෙනත් කටයුතු වලදී සිදුවන හානි පිළිබඳ විස්තර සටහන් පවත්වාගෙන යාම සඳහා වෙන වෙනම පොත් දෙකක් තබාගත යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දී එවැනි ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඈ) | 2022 අප්‍රේල් 04 දිනැති අංක 5/2022 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | රජයේ දේපල අස්ථානගතවීම සහ අවභාවිතය වැළැක්වීම මෙන්ම ඒවා උපරිම ඵලදායීභාවයෙන් ප්‍රයෝජනයට ගැනීම තහවුරු කිරීමට ආයතන ප්‍රධානීන්ට නියම කර තිබියදී, එයට පටහැනිව රු.3,038,690 ක පිරිවැයක් සහිත N1SSAN SYLPHY වර්ගයේ මෝටර් රථය ජනාධිපති ලේකම්ගේ අංක PS/IAD/TR/E(1)/Veh.Req.-Oth.ins සහ |

| | | |
|---|---|---|
| | | 2022 දෙසැම්බර් 03 දිනැති ලිපියෙන් කරන ලද ඉල්ලීම පරිදි 2022 දෙසැම්බර් 05 දින ජනාධිපති ලේකම් වෙත භාර දී තිබුණි. කෙසේවුවද, මෙම මෝටර් රථය ආයතන අතර විධිමත් වත්කම් හුවමාරුවක් වශයෙන් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. |
| (ඉ) | 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 | ගොඩනැගිලි ඉදිකිරීම, කුලියට ගැනීම හා සියලු වියදම් අඩු කිරීමට රාජ්‍ය ආයතන දැඩිව ක්‍රියාකල යුතු බව දක්වා තිබුණ ද, කුලියට ලබාගත් ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.7,919,375 ක මුදලක් වැය කර තිබුණි. |

**2.5 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම**

මුදල් රෙගුලාසි 371 සහ 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිමය අදාල විශේෂිත කාර්යයට ආසන්නතම දිනයකදී නිලධාරියා වෙත ලබාදියයුතු අතර නිලධාරියා විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අග්‍රිමය පියවිය යුතු වුවද දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 9 දෙනෙක් ලබාගත් රු. 5,000 සිට රු. 133,875 ක් දක්වා පරාසයක වූ අත්තිකාරම් මුදල් පියවීම දින 18 සිට 353 ක කාලපරාසයක් ගතකර තිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 දැක්ම හා මෙහෙවර**

අ. 1969 ජනවාරි 16 දිනැති අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතින් පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ අරමුණ, දැක්ම හා මෙහෙවර අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වුවත් එක් එක් විෂයයන්ට අදාලව රජයේ ආයතන විසින් නිකුත් කරනු ලබන නිර්දේශ මත පදනම්ව පමණක්

ආනයන බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. තවද, දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කිරීම සඳහා පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් හෝ ක්‍රියාපටිපාටියක් සකස් කර නොතිබුණු අතර බලපත්‍ර ගාස්තු අයකිරීම ප්‍රධාන කාර්යය ලෙස සළකා කටයුතු කරමින් රටෙහි සමස්ථ පාරිභෝජනයෙහි පුරෝකථනයන් සිදු කර ප්‍රමාණ පාලනය (Quality Control) නොකරන බව නිරීක්ෂණය විය.

ආ. 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ දී ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීම පහත පරිදි විය.

| බලපත්‍ර වර්ගය | බලපත්‍ර සංඛ්‍යාව 2021 | 2022 | වැඩිවීම/අඩුවීම | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| ඖෂධ | 2255 | 1832 | (423) | (19) |
| වාහන හා වාහන අමතර කොටස් | 284 | 647 | 363 | 128 |
| රසායනික ද්‍රව්‍ය සහ කාර්මික අමුද්‍රව්‍ය | 4313 | 3653 | (660) | (15) |
| සන්නිවේදන උපකරණ | 8982 | 4231 | (4751) | (53) |
| වෙනත් ආනයන හා අපනයන | 3742 | 3443 | (299) | (8) |

ආනයන සීමාකිරීම් හා තහනම් කිරීම් හේතුවෙන් 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ දී කාණ්ඩ 4 ක ආනයන අඩුවීමේ පරාසය සියයට 8 සිට සියයට 53 ක් වී තිබුණි. වාහන හා වාහන අමතර කොටස් ආනයනය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී සියයට 128 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණු අතර රට තුල උද්ගත වූ දැඩි ඉන්ධන අර්බුදය නිසා ඉලෙක්ට්‍රොනික් මෝටර් බයිසකල් හා පාපැදි ආනයනය වැඩි වීම හා අමතර කොටස් ආනයනයේ වැඩිවීම මෙම වර්ධනයට හේතු වී තිබුණි.

### 3.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් මෘදුකාංග සංවර්ධනය සඳහා අනුමත කරන ලද ආයතන සමඟ මෘදුකාංග පද්ධති සම්බන්ධ කිරීම, ජාලගත වීම හා ජාලගතව අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම වැනි කටයුතු සිදු කිරීම සඳහා ICTA ආයතනය සමඟ 2017 පෙබරවාරි 03 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබූ නමුත් එම ව්‍යාපෘතිය අපේක්ෂිත පරිදි සමාලෝචිත වර්ෂය තුළදී ද අවසන්ව නොතිබුණි. කෙසේවුවද, බලපත්‍ර නිකුත් කිරීම හා ආනයනයෙන් පසු බලපත්‍රයට අනුකූලව ආනයන සිදුකළ බවට නිශ්කාෂණ කාර්යය (හර කිරීම්) සඳහා 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වසර 10ක් තුල ආයතන කිහිපයක් වෙතින් නව පරිගණක හා උපාංග මිලදී ගැනීම

වෙනුවෙන් රු. 6,596, 994 ක් ද, පද්ධතියේ මෘදුකාංග හා අලුත්වැඩියා වෙනුවෙන් රු. 3,089,456 ක් ද වශයෙන් එකතුව රු.9,686,450 ක මුදලක් දරා තිබුණ ද ව්‍යාපෘතිය තවමත් අපේක්ෂිත මට්ටමින් ක්‍රියාත්මක වී නොතිබුණි. කෙසේවුවද, වාර්ෂික අයවැය ප්‍රතිපාදන මගින් මෘදුකාංග සංවර්ධනය සඳහා රු.25,000,000 ක් තවදුරටත් වෙන් කර තිබියදී එක්සත් ජනපද තානාපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක වැඩසටහනක් මගින් බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියක් දෙපාර්තමේන්තුවට ප්‍රධානයක් ලෙස ලබා දීම සඳහා එකඟතාවය පල කර තිබුණු අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2023 ජනවාරි 23 දින ලබා දී තිබුණි. ඒ අනුව වැඩිදියුණු කිරීම් කටයුතු සඳහා වූ මූලික රැස්වීම 2023 අප්‍රේල් 24 දින පවත්වා තිබුණි.

### 3.2 ප්‍රසම්පාදනයන්

#### 3.2.1 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළයුතු වුව ද දෙපාර්තමේන්තුව විසින් එපරිදි කටයුතු කර නොතිබුණි.

### 3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

01/2020 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 9.3 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන් 13 ක් සිටියද , ඉන් නිලධාරීන් 10 දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඇප තබා නොතිබුණි.

### 3.4 පාඩු හා හානි

2011 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලසීමාව සඳහා අංක PB – 5733 දරණ මොටර් රථයේ ඉන්ධන දහනය ලීටරයකට කිලෝමීටර 06 ක් වශයෙන් හඳුනාගෙන තිබුණද, 2018 දෙසැම්බර් 07 දින සිදු කල ඉන්ධන දහනය පරීක්ෂාවට අනුව එය ලීටරයකට කිලෝමීටර 10 ක් බවට තහවුරු වී තිබුණි. ඒ අනුව ඉන්ධන තුලනය ලීටරයකට කිලෝමීටර 06 බැගින් සිදුකිරීම නිසා 2011 සිට 2018 තෙක් කාලය තුල වාහනය භාරව සිටි රියදුරන් ඉන්ධන වංචාවක් සිදු කළේ දැයි විගණනයේ දී සැක සහිත විය.

### 3.5 අනාර්ථික ගනුදෙනු

අංක WPKG-1562 දරණ මෝටර් රථය සමාලෝචිත වර්ෂය තුළ දී ධාවනයෙන් තොරව මුදල් අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල් කර තිබුණු නමුත් එම කාලයේ දී අලුත්වැඩියා වියදම් සහ බැටරියක් යෙදවීම වෙනුවෙන් රු.386,011 ක වියදමක් දරා තිබුණි.

### 3.6 කළමනාකරණ දුර්වලතා

(අ) (i) සී ෂෙල්ස් සිට තායිලන්තය දක්වා ගමන් කළ මත්ස්‍යයින් ගබඩාකළ බහාළුම් රැගත් නෞකාවක් කොළඹ වරායට ආසන්න මුහුදු ප්‍රදේශයේ දී කාර්මික දෝෂයකට ලක්වී විදුලි සැපයුම නතර වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වරාය අධිකාරිය වෙත 2022 ජනවාරි 13 දින ළඟාවී තිබුණු අතර විදේශීය නෞකාවේ දේශීය නියෝජිතයා මගින් සොයාගත් දේශීය පෞද්ගලික ආයතනයකට කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මෙම මාළු බහාළුම් 2022 මාර්තු 09 දින විකුණා තිබුණි. කෙසේවුවද, 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 08 වන වගන්තිය අනුව රට තුලට ආනයනය කිරීමට පෙර ආනයන බලපත්‍රය ලබාගත යුතු වුවද, කාර්මික දෝෂයකට ලක්වීම නිසා පමණක් ලංකාවේ වරායට ළඟා වූ ද්‍රව්‍ය සඳහා පසුව හෙවත් 2022 මැයි 30 දින බලපත්‍රයක් නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

(ii) තවද, බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ආනයනකරු විසින් ඉල්ලීම සිදු කළ යුතු වුවද, එයට පටහැනිව ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ විසින් 2022 මැයි 25 දින බලපත්‍රයක් නිකුත්කරන ලෙස සිදුකළ ඉල්ලීම සහ කාබනික පොහොර නිශ්පාදනය කරන දේශීය සමාගම විසින් 2021 දෙසැම්බර් 10 දිනැති පෙර දාතම් කරන ලද ව්‍යාජ වාණිජ ඉන්වොයිසියක් ඉදිරිපත් කර තිබුණද, බලපත්‍රය නිකුත් කිරීමේදී එය ආනයන හා අපනයන පාලන ජනරාල්ගේ අවධානයට ලක් වී නොතිබුණි.

(iii) ගුණත්වයෙන් ඉහල භාණ්ඩ ආනයනය පිළිබඳව සැලකිලිමත්වීම ආනයන අපනයන පාලන ජනරාල්ගේ කාර්යභාරයක් වුවද, වරායට ළඟාවන අවස්ථාව වන විටත් මෙම මාළු තොගය නරක් වී අධික දුර්ගන්ධයකින් යුක්ත හා පරිසරයට හානිවන තත්ත්වයක පැවතියදී දෙපාර්තමේන්තුව බලපත්‍රය නිකුත් කිරීමට කටයුතු කර තිබුණි.

(ආ) රටේ ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගෙන භාණ්ඩ ආනයනය පාලනය සම්බන්ධයෙන් තම කාර්යයභාරය ඉටුකල යුතු බවට දෙපාර්තමේන්තු මෙහෙවර ප්‍රකාශයේ සඳහන් වූ නමුත් විදේශ විනිමය අර්බුදයක් රටතුල පවතින අවස්ථාවක සහ එතනෝල් ආනයනය සීමා කර තිබිය දී ඩොලර් 1,960,000 ක වටිනාකමකට ලංකා සීනි සමාගමට එතනෝල් නිෂ්පාදනයට අවශ්‍ය මොලැසස් ආනයනය සඳහා ආනයන බලපත්‍රයක් 2022 ජනවාරි 21 දින නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

## 4 යහපාලනය

### 4.1 රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීම

ඵලදායි තොරතුරු තාක්ෂණික පද්ධතීන් උපයෝගී කර ගනිමින් රජයේ ආදායම එකතු කිරීම, වැඩිදියුණු කිරීම සඳහා පාර්ශවකරුවන් විසින් සහ පාර්ශවකරුවන් අතර ගත යුතු පියවර නිර්දේශ කිරීම සඳහා වූ 2016 නොවැම්බර් මස 23 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අතුරු වාර්තාවේ නියෝග පරිදි "ආයතන විසි අටක සම්බන්ධීකරණය ඇතිව, බලපත්‍ර නිකුත් කිරීමේදී අදාල ආයතන වෙතින් අන්තර්ජාලය ඔස්සේ නිර්දේශ ලිපි ලබා ගැනීමට සැලසුම් සකස් කළ යුතු බව දන්වා" තිබුණද එම නිර්දේශය විගණන දිනය වූ 2023 මාර්තු 23 වන විටත් ක්‍රියාත්මක වී නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කාර්යයන් සඵලදායිව ඉටුකිරීමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් යොදවා නොතිබුණු අතර එම අංශය ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙක් සහ කළමනාකරණ සහකාරවරයෙක්ගෙන් පමණක් සමන්විත විය.

## 5 මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

2022 දෙසැම්බර් 31 දිනට අනුමත, තත්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 10 | 03 |
| තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| ද්විතික මට්ටම | 74 | 62 | 12 |
| ප්‍රාථමික මට්ටම | 20 | 18 | 02 |
| එකතුව | 111 | 92 | 19 |

(අ) දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 111 වන නමුත් තථ්‍ය කාර්යය මණ්ඩලය 92 ක් ව පැවති අතර එදිනට නියෝජ්‍ය/සහකාර පාලක, නීති නිලධාරි සහ සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් පුරප්පාඩුව පැවතුණි. තවද, තෘතියික මට්ටමේ නිලධාරින් 02 ක්, ද්විතියික මට්ටමේ නිලධාරින් 12 ක් සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරි 02 ක් පුරප්පාඩුව පැවතුණි.

(ආ) සංවර්ධන නිලධාරීන් සඳහා අනුමත කාර්යය මණ්ඩලයේ වූ තනතුරු 13 ක් සඳහා ඒ වන විට ද නිලධාරීන් බඳවා ගෙන තිබියදී එය ඉක්මවා සංවර්ධන නිලධාරීන් 11 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේ දී වැටුප් හා වේතන වශයෙන් රු. 5,038,133 ක් ගෙවා තිබුණි. කෙසේවුව ද, නව තනතුරු ඇතිකිරීම සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

ඊ.එම්.කේ.එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට,

ඊ.එම්.කේ.එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

## 4 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය

### 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුම් ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% | 49% - 0% |
| ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම හා හර කිරීම | √ | | | |
| ගැසට් ප්‍රකාශනය | √ | | | |
| මාර්ගෝපදේශ හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම | √ | | | |
| පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | √ | | | |

## 5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සාක්ෂාත් කරගැනීමේ කාර්යසාධනය

2015 වසරේදී එක්සත් ජාතීන්ගේ සමුළුවේදී ලෝක රාජ්‍ය නායකයන් විසින් ගෝලීය වශයෙන් 2030 වසරේදී ළඟා විය යුතු තිරසර සංවර්ධන අරමුණු 17 ක් සහ ඉලක්ක 169 ක් හඳුන්වා දෙන ලදී. තිරසර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රයෙහි මානවයා, මිහිකත සහ සෞභාග්‍ය වෙනුවෙන් වන්නා වූ ක්‍රියාකාරී සැලසුම්, පුළුල් නිදහස තුළ විශ්වීය සාමය ශක්තිමත් කිරීමේ වෑයම්, අන්ත දරිද්‍රතාවය ඇතුළු දිළිඳු බවෙහි ස්වරූපයන් තුරන් කිරීම, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන්, ගැහැනු ළමුන් සවිබල ගැන්වීම සාක්ෂාත් කර ගැනීම සහ සියලු පාර්ශ්වකරුවන්ගේ සහයෝගී ක්‍රියාකාරිත්වය මේ අතර වේ.

ගෝලීය තිරසර සංවර්ධනයට ප්‍රවේශයක් ලෙස ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනයන් ඊට අනුගත වීම සහ දිගුකාලීන සංවර්ධන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා වූ අවශ්‍යතාවය පිළිබඳව තිරසර සංවර්ධන සභාව අනුග්‍රහයෙන් පවත්වන ලද වැඩමුළු සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී විය. ඒ අනුව දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ කාර්යභාරය පදනම් කරගනිමින් දෙපාර්තමේන්තුවට අදාළ ගෝලීය තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්කයන් හඳුනාගැනීමක් සිදුවිය. පසුව දෙපාර්තමේන්තු අභිලාෂයන් මුදුන්පත් වන පරිදි දිගුකාලීන දැක්මකින් යුතුව තිරසර සංවර්ධන අරමුණු හා එහි ප්‍රගතිය මැනීම සඳහා වූ නිර්ණායකයන් ස්ථාපිත කරගන්නා ලදී. ස්ථාපිත කරගත් අරමුණු තුළින් රටේ තිරසර සංවර්ධනය සඳහා වූ කාලීන අවශ්‍යතාවය සැපිරීම උදෙසා අප දෙපාර්තමේන්තුව ක්‍රියාකාරකම් ආරම්භ කොට ඇත. දෙපාර්තමේන්තුවට අදාළව අරමුණු සකස්කර ගැනීමේදී පාදක කරගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු පහත පරිදි වේ

## 5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

**නගර සහ ජනාවාස පරිපූර්ණ ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස්කිරීම. (තිරසර සංවර්ධන අරමුණු අංක 11)**

ජීවත්වීම උදෙසා හිතකර පරිසරයක් රට තුළ ගොඩනැගීම සඳහා වාතයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය සිදුකළ යුතුය. නාගරීකරණය වූ ප්‍රදේශවල රථවාහන භාවිතය ශීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් එම ප්‍රදේශයන්හි වාතයේ අඩංගු විමෝචන වායු ප්‍රතිශතයේද වැඩිවීමක් දක්නට ඇත. මෙහිදී අවධානයට ලක් වූ කරුණ නම් රථ වාහනවලින් පිටවන විෂ දූමාරය මඟින් සැළකිය යුතු මට්ටමක වායු දූෂණයක් සිදුවන බවයි. එබැවින් වායු විමෝචන ප්‍රමිතීන්ට අනුකූල නොවන වාහන ශ්‍රී ලංකා රේගුව හරහා නිදහස් කිරීමට අවසර ලබා දීම නවතා ඇත.

**තිරසර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවක් සහතික කිරීම. (තිරසර සංවර්ධන අරමුණු අංක 12)**

පරිසර හිතකාමී ලෙස රසායනික ද්‍රව්‍ය සහ සියලුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම තුළින් මානව සෞඛ්‍යයට සහ පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමෙන් රජය අපේක්ෂා කරන සංවර්ධන ඉලක්කයන් කරා ළඟාවීමට දෙපාර්තමේන්තුව නියාමන ආයතනයක් ලෙස කටයුතු කරයි. එලෙස බලපෑම් ඇතිකරනු ලබන ආනයන හා අපනයන අයිතම හඳුනාගෙන ඒවා පාලනය හා නියාමනය කිරීම සඳහා ආනයන හා අපනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම, ආනයනය හා අපනයනය සම්පූර්ණයෙන්ම තහනම් කිරීම සහ ආනයන හා අපනයනයට අදාළ ප්‍රමිති නියම කිරීම අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් නිසියාකාරව සිදුකරනු ලබයි.

**තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇතිකිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සැම මට්ටමකටම ඵලදායී, වගකීම් සහිත පූර්ණ ආයතන ගොඩනැගීම. (තිරසර සංවර්ධන අරමුණු අංක 16)**

සියලුම මට්ටම්වල නිලධාරින්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමත්, එම තීරණ නිරන්තර ඇගයීමට භාජනය කිරීමෙන් ඉහළ සඵලත්වයක් තහවුරු කරගැනීමක් දෙපාර්තමේන්තුව ඉලක්ක කර ඇත. කාර්යමණ්ඩල රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් හරහා සියලුම මට්ටම්වල නිලධාරින් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සක්‍රීයව හවුල්වීමෙන් ඵලදායී වගවීමෙන් යුක්ත හා විනිවිදභාවයෙන් යුත් ආයතනයක් පිහිටුවීමට හැකියාව ලැබී ඇත.

ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය පූර්ණ වශයෙන් තහවුරු වන ආකාරයට දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය පහසුකම් එකී පාර්ශ්වයන් වෙත ලබා දී ඇත. දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කරන ලද තොරතුරු ඉතා වගවීමෙන් සහ ඉතා ඉක්මනින් ඉල්ලුම් කරන පාර්ශ්වයන්ගේ අතට පත් කරනු ලබන අතර, දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා ද යාවත්කාලීන තොරතුරු වෙතට පිවිසීමේ හැකියාව සලසා දී ඇත.

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශකය | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-75% | 75%-100% |
| **11.** නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම. | 11.6 2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළත්ව නගර නිසා සිදු වන ඒක පුද්ගල අහිතකර පරිසර බලපෑම අඩු කිරීම. | 1.ප්‍රමිතීන්ට අනුකූල නොවන වාහනනිෂ්කාශනය කිරීමට ඉඩ නොදීම. | | | ✓ |
| **12.** තිරසර පරිභෝජන සහ නිෂ්පාදනරටාව න් සහතික කිරීම. | 12.4 2020 වන විට එකඟතාවයට පත් වී ඇති අන්තර්ජාතිකවැඩසැලැස්ම ට අනුකූලව පරිසර හිතකාමී අන්දමට රසායනික ද්‍රව්‍ය හා සියලුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ක්‍රියාවට නැංවීම සහ එමඟින් මානව සෞඛ්‍යට සහ පරිසරයට සිදුවන්නා වූ අහිතකර බලපෑම අවම කිරීම සඳහා වාතයට, ජලයට සහ පසට ඒවා මුදා හැරීම අවම කිරීම. | 2. බාසල් සම්මුතිය සමාලෝචනය සම්පූර්ණ කිරීම. | | ✓ | |
| | | 3. අදාළ අධිකාරියේ නිර්දේශය මත පාලනය කරන ලද අයිතම ගණන. | | | ✓ |
| | | 4. ඇල්මක් ඇති පාර්ශවයන් සම පවත්වන ලද උපදේශන රැස්වීම් ගණන. | | ✓ | |
| | | 5. මාණ්ඩලික නිලධාරින් සම පවත්වන ලද උපදේශන රැස්වීම් ගණන. | | | ✓ |
| | | 6. දැනුවත් කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් ගණන. | | | ✓ |
| | 12.5 2030 වන විට අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම, අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ ඒවා | 7. විද්‍යුත් අපද්‍රව්‍ය ආනයනය අඩු කිරීම සඳහා වර්ෂය තුළ නිකුත් කරන ලද රෙගුලාසි ගණන. | ✓ | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නැවත භාවිතා කිරීම මඟින් අඩු කිරීම. | 8. ප්‍රතික්ෂේප කරන ලද ආනයනික භාවිතා ක ඉලෙක්ට්‍රොනික අයිතම ගණන ජංගම දුරකථන, පරිගණක.. ආදිය). | | | ✓ |
| **16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සැම මට්ටමකම ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.** | 16.7 සියලුම මට්ටම්වලදී ප්‍රතිචාරාත්මක, සියලුදෙනා අන්තර්ගතවූ, සහභාගීත්වයෙන් යුත් සහ නියෝජනයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම. | 9. පවත්වන ලද කාර්ය මණ්ඩල රැස්වීම් ගණන. | | | ✓ |
| | | 10. පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන. | ✓ | | |
| | 16.10 ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම තහවුරු කිරීම. | 11. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ක ඉල්ලීම් මත දින 14 ක් තුළ ලබාදුන් පිළිතුරු ගණන. | | | ✓ |
| | | 12. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අනුව දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ වරින් වර පළ කරන ලදවාර්තා, සංඛ්‍යාලේඛන සහ ප්‍රකාශන ගණන. | ✓ | | |

### 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය පහව යාමත් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකයට මුහුණ පෑමට සිදුවූ විදේශ සංචිත අර්බුදය තුළ රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති, ආර්ථික, සාමාජීය, දේශපාලන සහ පාරිසරික රටාවන් තුළ ඉතා සීරුවෙන් මෙහෙය වීමට සිදු විය.රාජ්‍ය වියදම් කළමනාකරණය සඳහා දිශානුගත මෙහෙයුම් ඉලක්ක තුළ සේවාලාභීන් සහ වෙනත් පහසුකම් සපයන ආයතන සමඟ කාර්යක්ෂම සේවාලාභී ප්‍රඥප්තියක් වෙනුවෙන් කැපවීමට හැකිවීම අප ලද ජයග්‍රහණයකි.

තවද, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළගා වීමට දෙපාර්තමේන්තුව වෙත ඇති කාර්යභාරය ඉටු කිරීමේදී වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් කටයුතු කිරීමට සිදුවේ. එහිදී, යම් යම් කාර්යයන් එම රාජ්‍ය ආයතනවලට පැවරෙන අතර එම කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය දෙපාර්තමේන්තුවේ ඉලක්ක සැපිරීම කෙරෙහි තීරණාත්මකව බලපානු ලබයි. එම රාජ්‍ය ආයතන, එකී කාර්යයන් ඉටු කිරීම කෙරෙහි දක්වන ප්‍රගතිය අප දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර කරුණක් වන අතර, එය මුහුණ දීමට සිදුව ඇති තවත් අභියෝගයකි. දෙපාර්තමේන්තුව මහත් පරිශ්‍රමයක් දරමින් මෙම අභියෝගයන් ජයගෙන තිරසර සංවර්ධනය කරා ගමන් කරමින් සිටියි.

## 6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ආනයන හා අපනයන නියාමනයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, බලපත්‍ර නිකුත් කිරීම/හර කිරීම සහ ආදායම් එක්රැස් කිරීම යන කාර්යයන් ඉටුකිරීම සඳහා තම සක්‍රීය දායකත්වය ලබාදෙන අතර, වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සේවාලාභීන් වෙත සැපයීම සඳහා වගවීමෙන් හා කැපවීමෙන් යුතුව කටයුතු කරයි.

| තනතුර,සේවය හා ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 13 | 10 | 03 |
| තෘතීය ශ්‍රේණිය | 04 | 02 | 02 |
| ද්විතීය | 74 | 62 | 12 |
| ප්‍රාථමික | 20 | 18 | 02 |
| **එකතුව** | **111** | **92** | **19** |

## 6.2 දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

දෙපාර්තමේන්තුවේ පවත්නා සේවක පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.තවද, මානව සම්පත් හිඟය පූර්ණය කර ගැනීමට පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පැවති පරිපාලන නිලධාරි තනතුර සඳහා වැඩ බැලීමේ පදනම මත පරිපාලන නිලධාරියෙකු පත් කිරීම.

- නීති නිලධාරි තනතුර සඳහා අනුමැතිය ඉල්ලීම.

එහෙත් මෙතෙක් සම්පූර්ණ සේවක පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමක් සිදුනොවීම මත දෙපාර්තමේන්තු කාර්යසාධනය කෙරෙහි යම් බලපෑමක් ඇති කිරීමට හේතු වුවද, නිසි මානව සම්පත් කළමනාකරණය මත 2022 වර්ෂයේ දෙපාර්තමේන්තු කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට ළඟා වීමට හැකි වී ඇත.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

2022 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය හා සෘජුවම බැඳෙන පහත සඳහන් කර ඇති වැඩසටහන්/පාඨමාලා සඳහා සේවකයන් යොමු කරවන ලදී.

| වැඩසටහන හෝ පාඨමාලාවේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහන කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය හා විදේශීය) | නිමැවුම්/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | 01 | 2021/2022 | - | - | දේශීය | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව වර්ධනය වීම. |
| සංවර්ධන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MDS) | 01 | 2021/2022 | රු.50,000 | - | දේශීය | සංවර්ධන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලැබීම. |
| කාර්යාල කාර්යය සහායක (කා. කා.ස.)සේවකයින් සඳහා රාජකාරී, ආගන්තුක සත්කාර හා ආචාරධර්ම පුහුණු වැඩසටහන | 05 | 2022.01.19 | - | - | දේශීය | කා.කා. ස.සේවකයින්ගේ සේවාවේ ගුණාත්මක භාවය ඉහළ යාම. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මොන්ට්‍රියෙල් ප්‍රෝටොකෝල් හා පාලන යාන්ත්‍රණය සම්බන්ධව දැනුවත් කිරීම සහ ආකල්ප හා ධනාත්මක චින්තනය වැඩි දියුණු කිරීමේ පුහුණු වැඩසටහන | 43 | 2022.03.12 | රු.325,000 | - | දේශීය | ආකල්ප හා ධනාත්මක චින්තනය වැඩි දියුණු වීම. |
| කොවිඩ් 19 වලින් පසු වෙළඳ ප්‍රවර්ධනය හා අලෙවිකරණය | 01 | 2022.08.28 - 2022.09.17 | - | ඇ. ඩො. 920 | විදේශීය | වෙළඳ ප්‍රවර්ධනය හා අලෙවිකරණය පිලිබඳ දැනුම |
| ලෝක වෙළෙඳ සංවිධානය මඟින් මෙහෙයවූ ආනයන බලපත්‍ර හා නිවේදන පිළිබඳ වැඩමුළුව (මාර්ගගත) | 03 | 2022.09.27 | - | - | විදේශීය | ලෝක වෙළඳ සංවිධාන රෙගුලාසි අනුව ආනයන බලපත්‍ර ලබාදීම පිලිබඳ දැනුම |
| රසායනික අවි සම්මුතිය පිළිබඳ වැඩසටහන | 02 | 2022.10.10 - 2022.10.15 | | ඇ.ඩො.400 + රු.15,926 | විදේශීය | රසායනික අවි සම්මුතිහි ගෝලීය ප්‍රවණතා පිළිබඳ දැනුම |
| ගිනි නිවීම පිළිබඳ වැඩසටහන | 02 | 2022.10.27 | රු.7000.00 | | දේශීය | ගිනි නිවීම පිලිබඳ දැනුම |

# 7 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූලවේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූලවේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | - | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම් (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛන යයාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූලවේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 5 | **විගණන විමසුම** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | රා.ප.ච. 16/2022 (1) අනුව නිලධාරීන් සේවයට කැඳවීම සීමා කිරීම. | නිශ්චිත කාල සීමාව තුළ පිළිතුරු සැපයීමට නිලධාරීන් දැනුම්වත් කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA/ 1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | රා.ප.ච. 16/2022 (1) අනුව නිලධාරීන් සේවයට කැඳවීම සීමා කිරීම. | නිශ්චිත කාල සීමාව තුළ පිළිතුරු සැපයීමට නිලධාරින් දැනුවත් කිරීම. |
| 6.3 | 2018 අංක 19 දරන විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටුව** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූලවේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදයේ ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අදාළ නොවේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේසඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම | අනුකූලවේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූලවේ. | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය කිරීම** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශනවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූලවේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූලවේ | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූලවේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූලවේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ. | සේවය අත්හිටවූ නිලධාරීන්ගේ ණයශේෂ පැවතීම. | විනය නියෝග ලද පසු ණය ශේෂ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කිරීම. |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූලවේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූලවේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | | ඉදිරියේදී එවැනි තත්ත්වයක් ඇති නොවීමට නිලධාරීන් දැනුම්වත් කිරීම. |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූලවේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූලවේ | | |
| 15 | **අදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.2 | රැස් කොට තිබූ අදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායම් ගිණුමට බැර කර තිබීම | අනුකූලවේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූලවේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 17.2 | ආයතනය පිලිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳමහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූලවේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්තිප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූලවේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීමහා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූලවේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූලවේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හී දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූලවේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූලවේ | | |
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූලවේ | | |

## සමාප්ති සටහන

2022 වසර ආරම්භය ශ්‍රී ලංකා ආර්ථිකය නිදහසින් පසු මෙතෙක් මුහුණ පෑ අභියෝගාත්මකම වසර විය. වසර ආරම්භයේදීම මෙරට විදේශ සංචිත ප්‍රමාණයේ පහළ යාමත්, වෙළඳ ගිණුමේ මෙන්ම ගෙවුම් ශේෂයේ හිඟය නිසාත්, රාජ්‍ය ණය ගිණුමේ ශේෂය ඉහළ යාම නිසා ආර්ථිකයට දැරීමට සිදුවූ වැය බරත් ලංකාවේ ආර්ථිකයට බලවත් පීඩනයක් ඇති කළේය. ඉහත ආර්ථික වාතාවරණය සමනය කිරීම සඳහා දිගුකාලින මෙන්ම කෙටිකාලින ආර්ථික ප්‍රතිපත්තිවලට රජයට යොමු වීමට සිදුවිය.ඒ සඳහා ඍජු දායකත්වයක් මෙම දෙපාර්තමේන්තුව විසින් දරන ලදී.

රටෙහි ආර්ථිකමය ස්ථාවරත්වය තවදුරටත් පවත්වා ගැනීම වෙනුවෙන් ගැසට්පත්‍ර නිකුත් කිරීම හරහා ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිත මත වැඩි වෙමින් පවතින පීඩනය සමනය කිරීමට හඳුනාගත් අත්‍යාවශ්‍ය නොවන හා හදිසි නොවන භාණ්ඩ ආනයනය නියාමනය කිරීම, නෛතික නොවන විදේශ විනිමය වෙළෙඳපොළ මෙහෙයුම් පුළුල් වීම මැඩලීම සඳහා විවෘත ගිණුම් ක්‍රමය ආදී ගෙවීම් ක්‍රම සීමා කිරීම යන ක්‍රියාමාර්ග ගන්නා ලදී.

එසේම මහජන සෞඛ්‍යාරක්ෂාව තහවුරු කරනු වස් ආනයන නියාමනය තුළින් වැදගත් පියවරයන් රැසක් අනුගමනය කළ වසරක් ලෙස 2022 වසර හඳුන්වා දිය හැකිය.ඒ සඳහා ආනයන ප්‍රමිතිගත කිරීමේ වැඩසටහන් යටතේ ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LP ගෑස් ) සහ ආනුෂංගික උපාංග ප්‍රමිති පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් මඟින් නියාමනය කිරීම සිදු කර ඇත. තවදුරටත්, රටේ ආර්ථිකමය වශයෙන් පවතින විදේශ විනිමය සංචිතවල ගැටලු සහිත තත්ත්ව යටතේ වුවද අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය හිඟයකින් තොරව පවත්වා ගැනීම සඳහා ද ක්‍රියාමාර්ගයන් ගන්නා ලදී.

රටේ මහජන ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ප්‍රමිතීන්ට අනුකූල නොවන භාණ්ඩ ආනයනය කරන ආනයනකරුවන්ගේ ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීම සඳහා ගැසට් කෙටුම්පත සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ මේ වන විට සාකච්ඡා කරමින් පවතී.

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ ගුණාත්මක බව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා විධිමත් පුහුණු වැඩසටහන් හා ආකල්ප හා ධනාත්මක චින්තනය වැඩි දියුණු කිරීමේ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

දෙපාර්තමේන්තුව එළඹෙන 2023 වර්ෂය තම සේවාලාභීන්ට වඩාත් ගුණාත්මකවූත් කාර්යක්ෂම වූත් සේවාවක් ලබා දෙමින් ආයතනික දැක්ම අනුව ගමන් කරමින් රටේ අභිවෘද්ධියට දෙපාර්තමේන්තුවේ උපරිම දායකත්වය ලබාදීම අපගේ ඉදිරි වසරේ අපේක්ෂාවයි.